**චක්‍රලේඛ අංක - 25/2025**

# පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය"
පැලවත්ත
බත්තරමුල්ල

**චක්‍රලේඛ අංක - 25/2025**

ED/09/12/11/01/01
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය"
පැලවත්ත, බත්තරමුල්ල
2025.07.03

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පාසල්වල විදුහල්පතිවරුන් වෙත,

## පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම

පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මෙයට පෙර නිකුත් කර ඇති 2024.06.26 දිනැති අංක 25/2024 දරන චක්‍රලේඛය, අභිබවා මෙම චක්‍රලේඛයේ උපදෙස් 2026 වර්ෂයේ දී හා ඉන්පසු ව පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමේ දී බලපවත්වනු ඇත.

## 2.0 ළමයින් ඇතුළත් කිරීම සඳහා මූලික සුදුසුකම්

2.1 පාසලට ඇතුළත් කරන වර්ෂයේ ජනවාරි 31 දිනට ළමයාගේ වයස අවුරුදු පහක් සම්පූර්ණ විය යුතු ය. වයස සනාථ කිරීම සඳහා උප්පැන්න සහතිකය ලබා ගත යුතු වේ. උප්පැන්න සහතිකය නොමැති නම් ඒ වෙනුවට උපන් දිනය සනාථ කිරීමට උප්පැන්න, විවාහ හා මරණ පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හෝ බලය පවරන ලද අදාළ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා හෝ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයකු විසින් නිකුත් කරනු ලබන අනුමාන වයස් සහතිකයක් පිළිගත හැකි ය. (වයස අවුරුදු පහට අඩු ළමයින් ඇතුළත් කර නොගැනීමට විදුහල්පතිවරුන් තරයේ වගබලා ගත යුතු ය.)

2.2 පාසලට ඇතුළත් කරන වර්ෂයේ, ජනවාරි 31 දිනට වයස අවුරුදු 6 හෝ 6 ට වැඩි ළමයින් ඇතුළත් කළ හැකි වන්නේ, එදිනට වයස අවුරුදු 6 ට අඩු, සුදුසුකම් සපුරා ඇති ළමයින් සියලු දෙනා ම ඇතුළත් කර ගැනීමෙන් පසුව ය.

## 3.0 පාසලට ළමයින් ඇතුළත් කරගැනීමට අදාළ ගණ

3.1 පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ළමයින්
3.2 අදාළ පාසලේ ආදි සිසු/සිසුවියන් වන මව්පියන්ගේ ළමයින්
3.3 දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහෝදර/සහෝදරියන්
3.4 අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපන අංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට ඍජුව ම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ ළමයින්
3.5 රජයේ සේවා අවශ්‍යතා මත /වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබූ රාජ්‍ය /සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල /රාජ්‍ය බැංකු නිලධරයන්ගේ ළමයින්
3.6 ළමයා සමඟ විදේශ රටක පදිංචි ව සිට පැමිණෙන තැනැත්තන්ගේ ළමයින්

## 4.0 තෝරා ගැනීමේ දී අවධානය යොමු විය යුතු කරුණු (සියලු ම ගණ සඳහා අදාළ වේ)

4.1 2026 හා ඉන් ඉදිරියට එක් සමාන්තර පන්තියකට සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගත යුතු ළමයින් සංඛ්‍යාව 35 ක් විය යුතුය. මෙයට අමතරව ක්‍රියාත්මක රාජකාරි අනුග්‍රහය යටතේ පංතියකට තෝරා ගනු ලබන ළමයින් සංඛ්‍යාව 5කි. ඒ අනුව එක් පංතියක ශිෂ්‍ය සංඛ්‍යාව 40 ක් වේ.

4.2 1960 අංක 05 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) හා 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) යන පනත් අනුව රජයට පවරා ගන්නා ලද පාසල්වල පුරප්පාඩු පිරවීමේ දී පවරා ගන්නා ලද අවස්ථාවේ තත් පාසලේ සිටි ආගමික සිසු අනුපාතය සැලකිල්ලට ගෙන, පුරප්පාඩු සංඛ්‍යාව, ආගම් හා එක් එක් ගණ අනුව බෙදා වෙන් කළ යුතු ය. යම් ආගමක එක් ගණයකට වෙන් කරන ලද ප්‍රමාණයට වඩා අඩු අයදුම්කරුවන් ප්‍රමාණයක් ඉල්ලා ඇති කල් හි එම පුරප්පාඩු එම ආගමට අයත් සෙසු ගණ අතර අනුපාතික ව බෙදා හැරිය යුතු ය. යම් ආගමකට අයත් අයදුම්කරුවන් නොමැති විට හෝ අඩුවෙන් සිටින විට හෝ එම පුරප්පාඩු අනුපාතික ව අනෙකුත් ආගම් අතර බෙදා හැරිය යුතු ය.

4.3 පළමුවන ශ්‍රේණිය සඳහා ළමයින් ඇතුළත් කර ගනු ලබන්නේ සිංහල/දෙමළ මාධ්‍ය සඳහා පමණි. ඉංග්‍රීසි මාධ්‍ය සඳහා ළමයින් ඇතුළත් කර ගනු නොලැබේ.

4.4 මව්පියන් පදිංචි ව සිටින්නේ එක ම ස්ථානයක නොවන කල් හි ඔවුන් නීතියෙන් වෙන් නොවූ අය වුව ද ඒ අය නීතියෙන් වෙන් වීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වූ අය නම්, ඒ බව ලිපි ලේඛනවලින් තහවුරු වන විට ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කර ඇති අයගේ (පියා හෝ මව) පදිංචි ස්ථානය, ළමයා පදිංචි ස්ථානය වශයෙන් සලකනු ලැබේ.

4.5 උසාවි තීන්දුවක් මඟින් නීත්‍යානුකූලව ස්ථිර ව දරුකමට හදා ගැනීම සඳහා පත් කරනු ලැබූ පුද්ගලයකු මව/පියා වශයෙන් පිළිගනු ලැබේ. ළමා නිවාසවල සිටින ළමයින්ගේ නීත්‍යානුකූල භාරකරු වශයෙන් ළමා නිවාසයේ භාරකරු සලකනු ලැබේ. නීත්‍යානුකූලව දරුකමට හදා ගන්නා පුද්ගලයා විසින් ඒ පිළිබඳ උසාවි තීන්දුව, අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජූනි 30 දිනට පෙර ලබා තිබිය යුතු ය. මව හා පියා දෙදෙනාම මිය ගොස් ඇති අවස්ථාවක පමණක් ළමයාට රැකවරණය සලසන පුද්ගලයාට එම ළමයාගේ භාරකරු ලෙස ළමයා වෙනුවෙන් ඉල්ලුම් කළ හැකි ය. මෙම භාරකරු, නිත්‍යානුකූල භාරකරු නොවුණ ද නිත්‍යානුකූල භාරකරු වශයෙන් සලකා කටයුතු කළ යුතු ය. දෙමව්පියන් මියගොස් ඇති බව හා භාරකරු වශයෙන් කටයුතු කරන බව ලිපි ලේඛන මඟින් සනාථ කර ගත යුතු ය.

4.6 ළමයාගේ මව හා පියා විදේශගත ව සිටි අවස්ථාවක දී හෝ දෙමාපියන්ගෙන් එක් අයකු ජීවතුන් අතර නොමැති විට සහ අනෙක් පුද්ගලයා විදේශගත ව ඇති විටක දී හෝ නීත්‍යානුකූලව භාරකාරත්වය පවරා නොතිබුණ ද, තාවකාලිකව ළමයාගේ භාරකාරත්වය උසුලන්නාට ළමයාගේ දෙමව්පියන්ගේ නමින් ඉල්ලුම් කළ හැකි අතර, ඇටර්නි බලපත්‍රයක් මඟින් නීත්‍යානුකූලව භාරකාරීත්වය පවරා ඇත්නම් සම්මුඛ පරීක්ෂණය සඳහා ද පෙනී සිටිය හැකි ය. ඉහත කරුණුවලට අදාළ වූ ලිපි ලේඛන සලකා බලනු ලබන්නේ ළමයාගේ දෙමාපියන්ට අදාළ ව ය. එසේ ම ළමයාගේ මව/පියා විදේශගත වී සිටීම හෝ ජීවතුන් අතර නොමැති වීම පිළිබඳ ව අදාළ සහතික මඟින් සනාථ කර ගත යුතු ය.

4.7 පාසලට අයදුම් කරන මව්පියන්/නීත්‍යානුකූල භාරකරුවන් පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ පදිංචි වී සිටිය යුතු අතර, අදාළ ග්‍රාම නිලධාරී විසින් අයදුම්කරුගේ පදිංචිය සහතික කළ යුතු ය. පෝෂිත ප්‍රදේශය යනු පාසල පිහිටි පරිපාලන දිස්ත්‍රික් බල ප්‍රදේශය හා පරිපාලන දිස්ත්‍රික් බල ප්‍රදේශ මායිමක යම් පාසලක් පිහිටා ඇති අවස්ථාවක මායිමේ ඇති අනෙක් පරිපාලන දිස්ත්‍රික්කයේ ආසන්න ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වේ. (ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට අදාළ ගණය සඳහා මේ සීමාව බල නො පැවැත්වේ).

## 5.0 ළමයින් ඇතුළත් කිරීම සඳහා අයදුම් කිරීමේ කාර්ය පටිපාටිය

5.1 අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සෑම වර්ෂයක ම, ඊළඟ වර්ෂය සඳහා පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමට බලාපොරොත්තුවන මව්පියන්ගෙන් හෝ නීත්‍යානුකූල භාරකරුවන්ගෙන් අයදුම්පත් භාර ගන්නා අවසන් දින සහිත ව අයදුම්පත් කැඳවීමේ දැන්වීම, රජයේ ප්‍රවෘත්ති පත්‍රවල සහ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත.

5.2 මව්පියන්/නීත්‍යානුකූල භාරකරුවන් තම ළමයා පාසලකට ඇතුළත් කිරීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දින වන විට සුදුසුකම් ලබන්නේ නම්, තෝරා ගැනීමට අදාළ ගණ යටතේ, රජයේ ප්‍රවෘත්ති පත්‍රවල සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලබන මෙම චක්‍රලේඛයේ අංක 01 උපලේඛනයේ සඳහන් ආකෘති පත්‍රයට අනුව ම සාදා ගත් අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අදාළ පාසලේ විදුහල්පති වෙත යොමු කළ යුතු ය. (මෙහිදී ජුනි 30 දිනට පැවතිය යුතු සුදුසුකම එදිනට සපුරා ඇත්නම් ඒ බව තහවුරු කිරීම සඳහා අයදුම්පත සමඟ ඉදිරිපත් කරනු ලබන ලේඛන අයදුම්පත් බාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර දිනයකදී නිකුත් කර ඇත්නම් එම ලේඛන වලංගු ලේඛන ලෙස සැලකිය යුතු ය.) එම අයදුම්පත්‍රය සමඟ ළමයා ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් පිළිබඳ තමන් විසින් ම සහතික කළ, පුවත්පත් හෝ වෙබ් අඩවි දැන්වීමේ සඳහන් තමන් ඉල්ලුම් කරන ගණයන්ට අදාළ සියලු ම ලිපි ලේඛනවල පිටපත් ද, ඒවා සනාථ කිරීමට දිවුරුම් ප්‍රකාශයක් ද සමඟ තම නම, ලිපිනය සඳහන් ලියාපදිංචි තැපැල සඳහා අවශ්‍ය මුද්දර සහිත ලියුම් කවරයක් ද එවිය යුතු ය. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවෙන් අයදුම්පත් ලැබෙන පාසල්වල පමණක් අයදුම්පත් අතින් වුව ද භාර ගත හැකි අතර, අතින් භාර ගත් බවට ලදුපතක් ලබා දිය යුතු ය.

5.3 ක්‍රියාන්විත රාජකාරි සඳහා ලබාදෙන විශේෂ අනුග්‍රහය යටතේ තම ළමයින් පාසල්වලට ඇතුළත් කිරීමට අපේක්ෂා කරන ක්‍රියාන්විත රාජකාරියේ යෙදුණු ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ සාමාජිකයින්, තම අයදුම්පත් අදාළ සේවාවේ සුභසාධක අධ්‍යක්ෂ වෙතින් ලබා ගෙන විධිමත් ව සම්පූර්ණ කර, ආයතන ප්‍රධානියා මඟින් අදාළ සුභසාධක අධ්‍යක්ෂ වෙත නියමිත දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

5.4 ක්‍රියාන්විත රාජකාරියේ යෙදුණු ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයන්ගේ ළමයින් ඍජුව ම පාසලට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන්නේ නම්, අදාළ පාසලේ විදුහල්පති වෙත ද සාමාන්‍ය පටිපාටිය යටතේ අයදුම්පත් ඉදිරිපත් කළ හැකි ය.

5.5 මව්පියන්/නීත්‍යානුකූල භාරකරු එක් පාසලකට ගණ කිහිපයක් යටතේ ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන්නේ නම්, එම එක් එක් ගණයට වෙන වෙන ම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව අදාළ ගණය ලියා එවිය යුතු ය.

5.6 අයදුම්කරුවන් අවම වශයෙන් තමාට ආසන්න පළාත් සභා පාසල් 03ක් ද ඇතුළු ව, පාසල් 06කට වත් ඉල්ලුම් කිරීම අනිවාර්ය වේ. පාසල් නම් කිරීමේ දී සෑම ඉල්ලුම් පත්‍රයක ම එම පාසල් ප්‍රමුඛතා අනුපිළිවෙළින් සඳහන් කළ යුතු ය. එසේ ම පාසල් 06කට ඉල්ලුම් කර එම පාසල්වලින් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඒ සඳහා සහභාගි නොවන අයදුම්කරුවන් හා අයදුම් නොකළ දෙමාපියන්/නීත්‍යානුකූල භාරකරුවන් පාසලක් නොලැබීම සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන

අධ්‍යක්ෂ වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු ය. එම අභියාචනා සැලකිල්ලට ගෙන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන පාසලකට තම ළමයා ඇතුළත් කළ යුතු ය.

5.7 සිංහල හා දෙමළ මාධ්‍ය දෙකෙන් ම ඉගැන්වීම් කටයුතු කරන පාසල් සඳහා අයදුම් කරන්නේ නම්, එම පාසල් සඳහා එක් භාෂා මාධ්‍යයකින් පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ය. ඉල්ලුම් කරන ලද මාධ්‍යයෙන් පාසලට තෝරා ගනු ලැබුවහොත් ඉන්පසු එම මාධ්‍ය වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

## 6.0 තෝරා ගැනීමේ කාර්ය පටිපාටිය

### 6.1 ඇතුළත් කර ගත හැකි ළමයින් සංඛ්‍යාවට වඩා අඩු අයදුම්පත් සංඛ්‍යාවක් ලැබුණු පාසල්

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව පාසලේ පළමුවන ශ්‍රේණියට ඇතුළත් කළ හැකි ළමයින් සංඛ්‍යාවට වඩා අඩු වන්නේ නම්, වයස සනාථ කර ගැනීමෙන් පසු ව අදාළ දිනයට ළමයින් පාසලට ඇතුළත් කර ගත යුතු ය.

### 6.2 ඇතුළත් කරගත හැකි ළමයින් සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ලැබුණු පාසල්

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට ලැබූ අයදුම්පත් සංඛ්‍යාව පාසලේ පළමුවන ශ්‍රේණියට තෝරා ඇතුළත් කළ හැකි ළමයින් සංඛ්‍යාවට වඩා වැඩි වන්නේ නම් පමණක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් තෝරා ගැනීම් කළ යුතු ය.

එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අදාළ පාසලේ විදුහල්පති විසින් පහත සඳහන් පරිදි තෝරා ගත යුතු ය.

6.2.1 **සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සංයුතිය.**

6.2.1.1 අදාළ පාසලේ විදුහල්පති (සභාපති)

6.2.1.2 විශ්‍රාම යාමට වසරකට වඩා වැඩි කාලයක් ඇති අදාළ පාසලේ ප්‍රාථමික අංශ ප්‍රධානියා/ප්‍රාථමික අංශයේ ජ්‍යෙෂ්ඨ ගුරුවරයෙක්

6.2.1.3 අදාළ පාසලේ වසරකට වඩා වැඩි සේවා කාලයක් සහිත, විශ්‍රාම යාමට වසරකට වඩා වැඩි කාලයක් ඇති නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරයෙක් හෝ ජ්‍යෙෂ්ඨ ගුරුවරයෙක් (ලේකම්)

6.2.1.4 පාසල් සංවර්ධන සමිති නියෝජිතයෙක් (එම පාසලේ ආදි ශිෂ්‍යයෙකු හෝ පාසලේ අධ්‍යයන/අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු නොවිය යුතු ය.)

6.2.1.5 ආදි ශිෂ්‍ය සංගම් නියෝජිතයෙක්

6.2.2 විදුහල්පති විසින් තම පාසලේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පාසල් සංවර්ධන සමිතියේ සාමාජිකයකු තෝරා ගැනීමේ දී පාසල් සංවර්ධන විධායක කමිටුවේ එකඟතාව මත ද, ආදි ශිෂ්‍ය සංගමයේ නියෝජිතයා තෝරා ගැනීමේ දී මෙම අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ආදි ශිෂ්‍ය සංගම් චක්‍රලේඛය අනුව පිහිටුවා ඇති ආදි ශිෂ්‍ය සංගමයේ කාරක සභාවේ එකඟතාව මත ද නියෝජිතයා පත්කර ගත යුතු ය. ආදි ශිෂ්‍ය සංගම් චක්‍රලේඛය අනුව ආදි ශිෂ්‍ය සංගම් පිහිටුවා ඇතත්, නියෝජිතයා පත්කර ගැනීම ගැටලුකාරී වන අවස්ථාවන්හි දී ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද, පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද ලබාදෙන උපදෙස් අනුව කටයුතු කළ යුතු ය.

ආදි ශිෂ්‍ය සංගම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර ව ආදි ශිෂ්‍ය සංගම් පිහිටුවා නොමැති අවස්ථාවන්හි දී එම චක්‍රලේඛ ප්‍රකාරව ආදි ශිෂ්‍ය සංගම් පිහිටුවා අදාළ නියෝජිතයා පත්කර ගැනීමට හෝ එසේ පිහිටුවීමට අපොහොසත්වන අවස්ථාවන්හි දී ආදි ශිෂ්‍ය නියෝජනය රහිත ව අනෙකුත් සාමාජිකයන්ගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් එම ගණයේ සම්මුඛ පරීක්ෂණ ද පැවැත්විය යුතු ය.

6.2.3 මෙසේ ඉහත කාරණාවලට එකඟ ව තෝරා ගත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් වෙත, පත්කිරීමේ ලිපියක් විදුහල්පති විසින් නිකුත් කළ යුතු ය. පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පිළිබඳ ව ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද, පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද, ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු ය.

6.2.4 අදාළ පාසලේ විදුහල්පති සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති වන අතර, එම පාසලේ වසරකට වඩා වැඩි සේවා කාලයක් සහිත, විශ්‍රාම යාමට වසරකට වඩා වැඩි කාලයක් ඇති නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ ගුරුවරයෙකු ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේකම් වශයෙන් කටයුතු කළ යුතු ය. එසේ ම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේකම්, අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ අවශ්‍යතාව අනුව සහයෝගය ලබා දිය යුතු ය.

6.2.5 තමන්ගේ දරුවෙකු හෝ මුණුපුරකු/මිණිපිරියක හෝ තමාගේ/කලත්‍රයාගේ සහෝදර සහෝදරියන්ගේ දරුවන් යම් පාසලකට ඇතුළත්වීමට අයදුම්කර ඇති විට ඔහුට/ඇයට එම පාසලේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකත්වය දැරිය නොහැකි ය. එහෙත් මෙය විදුහල්පතිට අදාළ නොවන නමුත්, ඉහත දක්වා ඇති පරිදි බැඳියාවක් පවතී නම්, ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යක්ෂ වෙත ද පළාත් පාසලක් නම් එම පාසල අයත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද දැනුම් දිය යුතු ය. තව ද විදුහල්පති හා ප්‍රාථමික අංශ ප්‍රධානියා හැර අනෙකුත් සියලුම සාමාජිකයන් අදාළ පාසලේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ/අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ පසුගිය වසර දෙකක කාලය තුළ නොසිටි අය විය යුතු ය.

6.2.6 පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම සඳහා පත් කරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ළමයින් තෝරා ගැනීමට අදාළ ව සියලු ම සාධක සලකා බලා සුදුසු පරිදි තීරණ ගෙන ක්‍රියාත්මක කිරීමේ බලතල හිමි වේ. එහි දී ලබා දී ඇති චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල වන පරිදි තෝරා ගැනීමේ කටයුතු කරගෙන යා යුතු අතර, චක්‍රලේඛයේ සඳහන් කරුණු පිළිබඳ විග්‍රහ කර ගැනීම ද, තෝරා ගැනීමේ ගැටලු පිළිබඳ තීරණ ගැනීම ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ වගකීම වේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියලු දෙනාගේ එකඟතාව සහිත ව මෙසේ ගනු ලබන තීරණ හා විග්‍රහ කිරීම් පිළිබඳ ව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති විසින් සාරාංශගත ව ලොග් සටහන් තැබිය යුතු අතර, වෙන ම පොතක වාර්තා කර අවශ්‍ය අවස්ථාවල දී ඉදිරිපත් කිරීම පිණිස සුරක්ෂිත ව තබා ගත යුතු ය. එසේම එම තීරණ පිළිබඳ ව ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද පළාත් පාසලක් නම් එම පාසල අයත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද දැනුම් දිය යුතු ය.

## 7.0 තෝරා ගැනීම සඳහා උපයෝගී කර ගන්නා ක්‍රමවේදය

7.1 යම් පාසලක පළමුවන ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩුවලින් පාසල මඟින් තෝරා ගන්නා ළමයින් සංඛ්‍යාව මෙහි දැක්වෙන ගණවලට අයත් ළමයින් අතරින් පහත සඳහන් ප්‍රතිශත අනුව සම්පූර්ණ කළ යුතු ය.

| | | |
|---|---|---|
| i. | පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ළමයින් | 50% |
| ii. | අදාළ පාසලේ ආදි සිසු/සිසුවියන් වන මව්පියන්ගේ ළමයින් | 25% |
| iii. | දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/ සිසුවියන්ගේ සහෝදර/සහෝදරියන් | 14% |
| iv. | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපන අංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුව ම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ ළමයින් | 06% |
| v. | රජයේ සේවා අවශ්‍යතා මත/වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබූ රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල/රාජ්‍ය බැංකු නිලධරයන්ගේ ළමයින් | 04% |
| vi. | ළමයා සමඟ විදේශ රටක පදිංචි ව සිට පැමිණෙන තැනැත්තන්ගේ ළමයින් | 01% |

(මෙම චක්‍රලේඛයේ 4.2 යටතේ යම් ආගමකට අයත් ගණවල අඩුවන පුරප්පාඩු එම ආගමේ අනිකුත් ගණ අතර බෙදාහැරීමේදී ඉහත 7.1 හි සඳහන් අනුපාත වෙනස් විය හැකිය.)

7.1.1 ළමයින් තෝරා ගැනීමේ දී ඉහත සඳහන් ගණයකට අයත් ළමයින් සංඛ්‍යාව සම්පූර්ණ නොවන්නේ නම්, එම පුරප්පාඩු සංඛ්‍යාව අනෙකුත් ගණ අතර ඉහත සඳහන් අනුපාතවලට අනුව බෙදා තෝරා ගත යුතු ය.

7.1.2 එක් එක් ගණ යටතේ සඳහන් කර ඇති ලකුණු ක්‍රමයට අනුව තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබා දිය යුතු ය. මෙහි දී එම ලකුණු ක්‍රමයට අනුව යම් ගණයක් යටතේ ලබා දිය හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 100 ක් වේ.

7.1.3 අයදුම්කරුවකු විසින් ගණ කිහිපයක් යටතේ ඉල්ලුම්කර ඇති අවස්ථාවකදී, එක් ගණයක් යටතේ සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවලින් එක් ලේඛනයක් හෝ ව්‍යාජ/කූට ලේඛනයක් බවට සනාථ වන්නේ නම්, එවැනි අවස්ථාවකදී එම අයදුම්කරු විසින් අනෙකුත් සියලු ගණ යටතේ ඉදිරිපත් කර ඇති අයදුම්පත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය.

7.1.4 ආසන්නතාව යටතේ සහ සහෝදර පදනම යටතේ පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනය ඉදිරිපත් කිරීමේ දී, තම නම් ලියාපදිංචි වී ඇති බවට ග්‍රාම නිලධාරී කාර්යාලයේ ඇති ඡන්ද හිමි නාම ලේඛන අනුව සටහන් කර ගෙන මව්පියන්/ නීත්‍යානුකූල භාරකරු විසින් ම සහතික කර ඉදිරිපත් කළ යුතු ය. මෙම විස්තර සටහන් කරගැනීම සඳහා පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමේ අයදුම්පත්‍රයේ (අංක 06) ඉඩකඩ සලසා දී ඇත. ඡන්ද හිමි නාම ලේඛනවල ලියාපදිංචි වූ විස්තර ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන මව්පියන්/නීත්‍යානුකූල භාරකරුවන් මෙම කොටස අනිවාර්යයෙන් ම සම්පූර්ණ කළ යුතු ය.

7.1.5 පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරන ලද පාසලට ඇති ආසන්නතාව සලකා බැලීමේදී අයදුම්කරුගේ නිවස (ප්‍රධාන දොරටුව) කේන්ද්‍රය කර ගෙන ඉල්ලුම් කරන පාසලේ ප්‍රධාන කාර්යාලයට (ප්‍රාථමික අංශය ප්‍රධාන පාසලින් බැහැර වෙනත් පරිශ්‍රයක පවතින්නේ නම් එම කාර්යාලයට) ඇති (අහස්) දුර අරය ලෙස ගෙන අඳින වෘත්තයක සීමාව තුළට ඇතුළත් වන පාසල් සඳහා ලකුණු අඩු කරනු ලැබේ. මෙහි දී ප්‍රධාන පාසලින් බැහැර ව වෙනම පරිශ්‍රයක ප්‍රාථමික අංශය පිහිටා ඇති පාසල් සම්බන්ධයෙන් ලකුණු අඩු කළ යුත්තේ, ප්‍රාථමික අංශය පිහිටි ස්ථානයට වන අතර ද්විතීයික අංශය පිහිටි ස්ථානයට නොවේ.

**යම් පාසලක් ඉහත වෘත්ත සීමාව තුළ පිහිටිය ද ගංගා, කලපු, වගුරුබිම්, රක්ෂිත වනාන්තර ආදී ස්වභාවික බාධාවන් හෝ අධිවේගී මාර්ග පවතින අවස්ථාවල දී පමණක් නිවසේ සිට එම පාසලට ගමන් කල හැකි කෙටිම මාර්ග දුර ඉල්ලුම් කරන පාසලට ඇති කෙටිම මාර්ග දුරට වඩා වැඩි නම් ලකුණු අඩු නොකළ යුතු ය.** එහිදී අයදුම්කරුවන් පිළිගත හැකි සාක්ෂි සහිතව මාර්ග සිතියම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.

ඉහත අවස්ථාවන්හි දී ආසන්නතාව පරීක්ෂා කිරීම සඳහා රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති පරිමාණය 1:10000 සිතියම භාවිතා කළ යුතු අතර, මෙයට අමතරව ගූගල් සිතියම ද (Google Map) භාවිතා කළ හැකිය.

ඉහත මාර්ග දුර ගණනයේ දී ප්‍රායෝගිකව ගැටලු සහගත අවස්ථා විසඳාගැනීම සඳහා සාධාරණ හා පොදු තීරණයක් ගැනීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලවලට බලතල හිමිවන අතර, අවශ්‍යතාවය මත ස්ථානීය පරීක්ෂණ මඟින් කරුණු සනාථ කර ගැනීමට කටයුතු කළ හැකිය. එම තීරණ හේතු සහිතව සටහන් තබා ගත යුතු ය.

7.1.6 පදිංචිය සනාථ කිරීමට අදාළ ලිපි ලේඛන, ඉල්ලුම් කරන අවස්ථාවේ දී පදිංචි ව සිටින ස්ථානයට අදාළ ව තිබිය යුතු ය.

## 7.2 පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ළමයින් - 50%

මෙම ගණය යටතේ පෝෂිත ප්‍රදේශය තුළ (4.7 උපවගන්තියට අනුව) පදිංචි වී සිටින සියලු දෙනාට ම අයදුම් කළ හැකි ය. මෙහි දී අයදුම්කරුවන් අයදුම්කරන ස්ථානයේ පදිංචි වී සිටීම සහ ඒ බව සනාථ කිරීම අනිවාර්ය වේ. අයදුම්කරුගේ සැබෑ පදිංචිය භෞතිකව සනාථ කර ගැනීම මෙම චක්‍රලේඛයේ 9.3.3 හි සඳහන් ස්ථානීය පරීක්ෂාව මඟින් ද, ලිඛිත ව සනාථ කර ගැනීම පදිංචියට අදාළ ප්‍රධාන ලේඛන පරීක්ෂාව මඟින් ද සිදු කළ යුතුය.

මෙහි දී පදිංචිය සනාථ කිරීමට අදාළව ඉදිරිපත් කළ යුතු ලේඛන පහත දැක්වේ.

### 7.2.1 පදිංචිය තහවුරු කරන ප්‍රධාන හා අතිරේක ලේඛන

පදිංචිය තහවුරු කරන ප්‍රධාන හා අතිරේක ලේඛන අදාළ පුද්ගලයාගේ නමට පැවරී, අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දින සිට ආසන්න පූර්ව වර්ෂ 05ක කාලය සැළකිල්ලට ගෙන පහත ප්‍රතිශත අනුව ඊට හිමි ලකුණු ලබාදිය යුතු ය.

වර්ෂ 05 ක් හෝ ඊට වැඩි 100%
වර්ෂ 05 ට අඩු වර්ෂ 04 දක්වා 80%
වර්ෂ 04 ට අඩු වර්ෂ 03 දක්වා 60%
වර්ෂ 03 ට අඩු වර්ෂ 02 දක්වා 40%
වර්ෂ 02 ට අඩු වර්ෂ 01 දක්වා 20%
වර්ෂ 01 ට අඩු මාස 06 දක්වා 10%
මාස 06 ට අඩු 05%

**7.2.1.1 පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන**

පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන ලෙස පහත ලේඛන පිළිගැනේ.

- ✓ සින්නක්කර ඔප්පු
- ✓ බිම්සවිය සහතිකය
- ✓ තෑගි ඔප්පු
- ✓ දීමනා පත්‍ර
- ✓ රජයේ ප්‍රදාන (හිමිකරු මියගොස් ඇත්නම් අයදුම්කරු/කලත්‍රයා අනුප්‍රාප්තිකයකු ලෙස නම් කර තිබිය යුතු අතර, අදාළ බලධාරියා විසින් ඒ බව සනාථ කළ යුතුය.)
- ✓ විහාර හා දේවාල ගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බදු ඔප්පු හෝ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් සහතික කරන ලද අදාළ විහාරාධිපති විසින් නිකුත් කරන සහතික
- ✓ පත් ඉරු මඟින් සනාථ කර ඇති වසර 10කට වැඩි කාලයක් සහිත ප්‍රකාශන ඔප්පු
- ✓ රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයකින් ගෙවීමේ පදනම මත මිල දී ගෙන, සම්පූර්ණ මුදලම ගෙවා අවසන් කර ඇති නමුත්, මෙතෙක් අදාළ ආයතන මඟින් එහි හිමිකරු වෙත එම දේපල පවරා නොමැති නිවාස (සම්පූර්ණ මුදලම ගෙවා අවසන් කරන ලද බවට අදාළ ආයතනයෙන් ලබාගත් ලිඛිත තහවුරුවක් ඉදිරිපත් කළ යුතුය.)

(සින්නක්කර ඔප්පු හා තෑගි ඔප්පු ප්‍රකාශන ඔප්පුවකින් ලියා ඇත්නම් එම ප්‍රකාශන ඔප්පුව වසර 10ක් හෝ ඊට වැඩි කාලයක් ලියාපදිංචි වී තිබිය යුතුය. එසේ නොමැති නම් ප්‍රකාශන ඔප්පුව ලියාපදිංචි කර ඇති දිනට පෙර වසර 10 කට වැඩි කාලයක් පදිංචිව සිටි බවට ලේඛන මඟින් තහවුරු කළ යුතු ය.)

I. පදිංචි ස්ථානයේ හිමිකම ඔප්පු කිරීමට ඉදිරිපත් කරනු ලබන ඉහත ලේඛන ඉල්ලුම්කරුගේ/කලත්‍රයාගේ නමට ඇත්නම් **- ලකුණු 20**

II. ඉල්ලුම්කරුගේ/කලත්‍රයාගේ මවගේ හෝ පියාගේ නමට හිමිකම ඇත්නම් **- ලකුණු 16**

පාසලට ඇතුළත් කිරීමට නියමිත ළමයාගේ හෝ එම ළමයාගේ අවිවාහක සහෝදරයෙකුට /සහෝදරියකට හිමිකම පවරා ඇති අවස්ථාවලදී අයදුම්කරුගේ නමට හිමිකම ඇති ලෙස සලකා ලකුණු ලබා දිය යුතු ය.
අදාළ වර්ෂ 5ක කාලය තුළ අයදුම්කරුගේ හෝ කලත්‍රයාගේ මව/පියා නමින් පැවති හිමිකම අයදුම්කරු හෝ කලත්‍රයා වෙත පවරා ඇත්නම්, ඒ ඒ පාර්ශ්ව වෙත හිමිකම පැවති කාලච්ඡේද දෙකම සැළකිල්ලට ගෙන, සම්පූර්ණ කාලසීමාව ආවරණය වන පරිදි අනුපාතිකව ලකුණු ලබා දිය යුතු ය.

(ඉහත පාර්ශ්ව හැර හිමිකම අනෙකුත් අයගේ නමට ඇත්නම් මෙම ලකුණු ලබා නොදිය යුතු ය. අවශ්‍ය වන්නේ නම් පත්ඉරු හා දෙවන පිටපත් පරීක්ෂා කර හිමිකම තහවුරු කරගත යුතු ය.)

- ✓ අයදුම්කරුගේ/කලත්‍රයාගේ නමින් පමණක් ඇති අඛණ්ඩ ව ලියාපදිංචි කළ බදු ඔප්පුව, (අවශ්‍ය වන්නේ නම් බදු දීමනාකරුගේ අයිතිය සම්බන්ධව පත්ඉරු මඟින් සනාථ කළ යුතුය.) මේ යටතේ ලකුණු උපයාගැනීමට නම් බදු ඔප්පුව අවම වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දිනට පෙර ලියාපදිංචි කර තිබිය යුතු අතර, එය අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දින සිට ඉදිරි වර්ෂයක කාලයක් සඳහා වලංගු විය යුතු ය. අදාළ දේපල/නිවස සඳහා වෙනම වරිපනම් අංකයක්/ගෘහ අංකයක් තිබිය යුතු ය.
  - ලකුණු 10

  (ලියාපදිංචි බදු ඔප්පුවක් ප්‍රකාශන ඔප්පුවකින් ලියා ඇත්නම් එම ප්‍රකාශන ඔප්පුව වසර 10ක් හෝ ඊට වැඩි කාලයක් ලියාපදිංචි වී තිබිය යුතු ය.)

  අදාළ වර්ෂ 05ක කාලය තුළ ලියාපදිංචි බදු ඔප්පු හිමියකු, එම දේපලේ හිමිකරුවකු බවට පත්ව ඇත්නම්, ඒ ඒ කාලච්ඡේද වෙන වෙනම සැළකිල්ලට ගෙන අදාළ ප්‍රතිශත අනුව ලකුණු ලබා දිය යුතු ය. මෙහි දී එම ස්ථානයේ අදාළ පුද්ගලයාගේ පදිංචිය, අඛණ්ඩ ව තිබිය යුතු ය.

- ✓ අයදුම්කරුගේ/කලත්‍රයාගේ නමින් පමණක් ඇති රජයේ නිල නිවාස ලේඛනය (දෙපාර්තමේන්තු ප්‍රධානිගේ තහවුරු කිරීමේ ලිපිය) තනිකඩ නිල නිවාසවල පදිංචිකරුවන් අදාළ කර නොගත යුතු ය. - ලකුණු 10

- ✓ අයදුම්කරුගේ/කලත්‍රයාගේ නමින් පමණක් ඇති ගෙවල් කුලී පනත යටතේ ලියාපදිංචි වී කුලී නිවැසියන් බව සනාථ කරනු ලබන ලේඛන - ලකුණු 10

- ✓ අයදුම්කරුගේ/කලත්‍රයාගේ නමින් පමණක් ඇති, රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයකින් ගෙවීමේ පදනම මත මිල දී ගෙන ඇති එහෙත්, ගෙවීම අවසන් කර නොමැති නිවාස ලේඛන (රජයේ/අර්ධ රාජ්‍ය ආයතනයක් සමඟ ඇති කර ගත් විකුණුම් ගිවිසුම් සම්බන්ධයෙන් එම ගිවිසුම හා ගෙවීම් කරන ලද ලදුපත් ද ඉදිරිපත් කළ යුතුය.) - ලකුණු 10

- ✓ අයදුම්කරු/කලත්‍රයා අඛණ්ඩ ව වසර 10කට වඩා වැඩි කාලයක් රජයේ ඉඩමක (අදාළ ලිපිනයේ) පදිංචි බවට අදාළ ප්‍රදේශයේ නාගරික කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන සහතික (අදාළ සහතිකය අනෙකුත් අයගේ නමට ඇත්නම් මෙම ලකුණු ලබා නොදිය යුතු ය.)
  - ලකුණු 05

- ✓ අයදුම්කරු/කලත්‍රයා වතු ආශ්‍රිත නිවාසවල පදිංචිව සිටී නම් අදාළ වතු අධිකාරී සහ අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන සහතික
  - ලකුණු 05

- ✓ වෙනත් පිළිගත හැකි ලේඛන - ලකුණු 04

  පදිංචි ස්ථානයට අදාළ ව ඉහත දක්වා ඇති ලේඛන නොමැති නමුත්, අයදුම්කරු/කලත්‍රයා අදාළ ලිපිනයේ අඛණ්ඩ ව ස්ථිර පදිංචිකරුවකු නම්, අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දින වන විට පූර්වාසන්න වර්ෂ 06ක් හෝ ඊට වැඩි කාලයක් වූ, පදිංචි ලිපිනය සනාථ කෙරෙන පහත ලේඛන 04ක් සඳහා එක් ලේඛනයකට අයදුම්කරු/කලත්‍රයා නමින් නම් ලකුණු 01 බැගින් හෝ අයදුම්කරු/කලත්‍රයාගේ මවගේ හෝ පියාගේ නමින් නම් ලකුණු 0.5 බැගින් ද ලබා දිය යුතු ය.

විදුලි බිල්පත්, ජල බිල්පත් , වරිපනම් බදු බිල්පත්, අක්කර බදු බිල්පත්, අයදුම්කරු/කලත්‍රයාගේ උප්පැන්න සහතික

ඉහත ලේඛන අනිවාර්යයෙන් ම පූර්වාසන්න වර්ෂ 6කට හෝ ඊට වැඩි කාලයකට අදාළ විය යුතු අතර, එම ලේඛනවලින් අවම වශයෙන් තුනක්වත් තිබේනම් පමණක් මේ සඳහා ලකුණු ලබා දිය යුතු ය.

අදාළ වර්ෂ 06ක කාලය තුළ අයදුම්කරුගේ හෝ කලත්‍රයාගේ මව/පියා නමින් ගෙවන ලද බිල්පත් පසුව අයදුම්කරු හෝ කලත්‍රයා නමින් ගෙවා ඇත්නම්, ඒ ඒ පාර්ශ්ව විසින් බිල්පත් ගෙවන ලද කාලච්ඡේද දෙකම සැළකිල්ලට ගෙන, ලකුණු ලබා දිය යුතු ය.

- ✓ රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයක් සතු දේපලක (ඉල්ලුම් කරන ලද ස්ථානය) උපන්දා සිට පදිංචිව සිටින නමුත්, එම දේපල සඳහා පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනයක් නොමැති අවස්ථාවකදී, එහෙත් කිසිදු ආසන්න පාසලක් සඳහා ලකුණු නොකැපෙන, අයදුම්කරු/කලත්‍රයා ට අදාළ ලිපිනයෙහි පූර්වාසන්න වර්ෂ 5ක ඡන්ද ලියාපදිංචිය ඇති, උපන්දා සිට අයදුම්කරු/කලත්‍රයා අදාළ ස්ථානයේ පදිංචි බවට තහවුරු කළ හැකි (උප්පැන්න සහතිකය, අස්වීම් සහතිකය............ආදිය මඟින්) විවාහයෙන් පසු ද මේ දක්වා ඉල්ලුම් කරන ලිපිනයේ ම පදිංචිව සිටින බවට තහවුරු කරන අයදුම්කරුවන්ට (එම දේපල රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයක් සතු දේපලක් වන බවටත්, අයදුම්කරු එම දේපලෙහි උපන්දා සිට පදිංචිව සිටින බවටත්, අදාල ආයතන මඟින් කරන ලද තහවුරුවක් අයදුම්කරු විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.) - ලකුණු 15

  මෙහිදී, ඉහත කරුණු පාසල් සම්මුඛ පරීක්ෂණ කමිටුව විසින් විධිමත් ව පරීක්ෂා කර නිසි පරිදි තහවුරු කරගෙන ලකුණු ලබා දිය යුතු අතර, වෙනම ලේඛනයක එම අයදුම්කරුවන්ගේ තොරතුරු සටහන් කර තබාගත යුතු ය. එසේ ම, මේ සම්බන්ධව ලොග් සටහන් ද තබාගත යුතු ය.

- ✓ වතු අධිකාරීවරයෙකු යටතේ පාලනයවන වතුවල කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සේවකයින් පදිංචි කර ඇතිවිට, ඉහත පදිංචිය තහවුරු කරන කිසිදු අවස්ථාවක් යටතේ සුදුසුකම් සපුරා නොමැති නම්, වතු අධිකාරී විසින් වතු ආශ්‍රිත නිවාසවල පදිංචිය තහවුරු කිරීම සඳහා නිකුත් කර ඇති ලිපිය ග්‍රාම නිලධාරී විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර ඇති අවස්ථාවකදී වෙනත් කිසිදු පාසලකට ලකුණු නොකැපෙන්නේ නම් පමණක්, එවැනි පදිංචිකරුවන් සඳහා

  - ලකුණු 15

**(උපරිම ලකුණු 20)**

**"මෙම ගණය යටතේ ඉහත කරුණුවලට අදාල ව පදිංචිය තහවුරු කිරීම සඳහා හිමිවන ලකුණු උපයා ඇති අයදුම්කරුවන්ට පමණක් මින් ඉදිරියට ඇති කොටස් සඳහා ලකුණු ලබා දිය යුතු ය".**

### 7.2.1.2 පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛන

අයදුම්කරු හෝ කලත්‍රයා නමින් ඇති පහත සඳහන් ඕනෑම ලේඛන 05ක් සඳහා එක් ලේඛනයකට, එක් ලකුණක් බැගින් **ලකුණු 05**

(ජාතික හැඳුනුම්පත හෝ රියදුරු බලපත්‍රය/ස්ථාවර දුරකථන බිල්පත් (රූහැන් සහිත) / පාසල් හැර යාමේ සහතිකය/ විවාහ සහතිකය/ ළමයාගේ උප්පැන්න සහතිකය/ අයදුම්කරුගේ හෝ කලත්‍රයාගේ බැංකු පොත/ වාහන ලියාපදිංචි සහතිකය හෝ වාහන ආදායම් බලපත්‍රය හෝ වාහන රක්ෂණ සහතිකය.)
විදුලි බිල්පත්/ ජල බිල්පත්/ වරිපනම් බදු බිල්පත්/ අක්කර බදු බිල්පත් පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන යටතේ වෙනත් පිළිගත හැකි ලේඛනයක් ලෙස ලකුණු උපයා නොමැති නම් පමණක්, පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛනයක් ලෙස යොදාගත හැකිය.

**(උපරිම ලකුණු 05)**

**7.2.2 පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිය**

ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී ඇති බව සටහන් කිරීමට අයදුම්පතෙහි ලබා දී ඇති කොටස (අංක 06) සම්පූර්ණ කර ලියාපදිංචිය සනාථ කළ යුතු ය.

**7.2.2.1** ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචියට ලකුණු ලබා දීමේ දී අයදුම් කරන වර්ෂයට පෙර වර්ෂයේ සිට ආසන්න පසුගිය වර්ෂ 05ක් සලකා බලනු ලැබේ.

ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිය සඳහා පහත පරිදි ලකුණු ලබා දිය යුතු ය.

**වගු අංක - (I) ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචිය සඳහා ලකුණු ලබා දීම**

| | විස්තරය | ලකුණු |
|---|---|---|
| (i) | මව හා පියා යන දෙදෙනාගේ / නීත්‍යානුකූල භාරකරුගේ නම වර්ෂ 05ක් ලියාපදිංචි වී තිබේ නම් **<u>හෝ</u>** මව/ පියාගේ නම වර්ෂ 5ක් ද, විවාහය ලියාපදිංචි කර වර්ෂයක් ඇතුළත කලත්‍රයාගේ නම ඡන්දහිමි නාම ලේඛනයේ ඇතුළත් කිරීමට අයදුම් කර ඇත්නම් සහ ඉන් අනතුරුව අඛණ්ඩව වර්ෂ 04 ක් කලත්‍රයාගේ නම ද ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී තිබේ නම් | 25 |
| (ii) | මව/ පියාගේ නම වර්ෂ 5ක්ද කලත්‍රයාගේ නම ඕනෑම වර්ෂ 04ක් ද ලියාපදිංචි වී තිබේ නම් | 22.5 |
| (iii) | මව/ පියාගේ නම වර්ෂ 5ක්ද කලත්‍රයාගේ නම ඕනෑම වර්ෂ 03ක් ද ලියාපදිංචි වී තිබේ නම් | 20 |
| (iv) | මව /පියාගේ නම වර්ෂ 05ක්ද කලත්‍රයාගේ නම ඕනෑම වර්ෂ 02ක් ද ලියාපදිංචි වී තිබේ නම් | 17.5 |
| (v) | මව / පියාගේ නම වර්ෂ 05ක් ද කලත්‍රයාගේ ගේ නම ඕනෑම වර්ෂයක් ද ලියාපදිංචි වී තිබේ නම් | 15 |
| (vi) | මව / පියාගේ නම පමණක් වර්ෂ 05ක් ලියාපදිංචි වී තිබේ නම් | 12.5 |

**සැ.යු -:** එක් අයෙකුට එක් වර්ෂයකට ලකුණු 2.5 බැගින් ලබා දී ඉහත ලකුණු ක්‍රමය සකස් කර ඇත. එමනිසා මෙම ලකුණු ක්‍රමයෙන් ආවරණය නොවන අවස්ථාවන්හි දී ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වී සිටින කාලයට එක් අයෙකුට ලකුණු 2.5 බැගින් වන සේ ලකුණු ලබා දිය යුතු ය.

නීත්‍යානුකූල භාරකරු මව හා පියා යන දෙදෙනාම සේ සලකනු ලබන බැවින්, මව හා පියා යන දෙදෙනාට ම ලියාපදිංචි වර්ෂ සංඛ්‍යාව අනුව හිමි වන ලකුණු (එනම් වර්ෂයකට ලකුණු 05ක්) නීත්‍යානුකූල භාරකරුට ලබා දිය යුතු ය. **(උපරිම ලකුණු 25)**

**7.2.2.2** පෙර වර්ෂවල ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වී සිටි ඉල්ලුම්කරුගේ කලත්‍රයා විදේශගත වී සිටී නම් හෝ මිය ගොස් ඇත්නම් හෝ නීත්‍යානුකූල ව

දික්කසාද වී ඇත්නම් හෝ අදාල ලේඛන පරීක්ෂා කර දෙදෙනාම සිටින සේ සලකා ලකුණු ලබා දිය යුතු ය.

**7.2.2.3** පදිංචිය සඳහා ලකුණු ලබා දෙන්නේ දැනට පදිංචි වී සිටින ස්ථානයේ ලිපි ලේඛන මගිනි. එහෙත් දැනට පදිංචි වී සිටින ස්ථානයේ පදිංචි වීමට පෙර පෝෂිත ප්‍රදේශය තුළ තවත් ස්ථානයක පදිංචි වී සිටි අයදුම්කරුවකු තම අවම වසර 05ක පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛන ස්ථාන දෙකෙන් ම ඉදිරිපත් කරන විට (පෙර පදිංචි ස්ථානය ද 7.2.1.1හී සඳහන් ලේඛන මඟින් සනාථ කරගත යුතු ය). එම ස්ථාන දෙකෙහිදීම ඉල්ලුම්කරනු ලබන පාසලට වඩා ආසන්නව පිහිටි ළමයාට ඇතුළත් විය හැකි පාසල්, එකම පාසල් වන්නේ නම් පමණක් ස්ථාන දෙකෙන් ම ඉදිරිපත් කර ඇති ඡන්ද හිමි නාමලේඛන, දැනට පදිංචි ස්ථානයේ ඡන්ද හිමි නාමලේඛන සේ සලකා ලකුණු ලබා දිය යුතු ය.

**7.2.3** අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දින සිට පූර්වාසන්න වර්ෂ පහක් තුළ ක්‍රියාත්මක වූ රජයේ සංවර්ධන ව්‍යාපෘති හෝ සංවර්ධන යෝජනා ක්‍රම හේතුවෙන්, යම් ප්‍රදේශයක පදිංචිකරුවන් එම ප්‍රදේශවලින් ඉවත් කොට වෙනත් ප්‍රදේශයක පදිංචි කරවා ඇති අවස්ථාවක හෝ රජයේ ඉහත සංවර්ධන කටයුතු හේතුවෙන් අවතැන් වූ පදිංචිකරුවන් විසින් රජයෙන් වන්දි මුදල් ලබාගෙන වෙනත් ප්‍රදේශයක ස්ථිරව පදිංචි වී ඇති අවස්ථාවක, ඔවුන්ගේ ළමයින් පාසල්වල පළමුවන ශ්‍රේණියට ඇතුළත් කිරීමේ දී, පෙර සහ වර්තමාන පදිංචියට අදාළ ව ස්ථාන දෙකෙන්ම ඉදිරිපත් කර ඇති ලේඛන, එකම ස්ථානයකට අදාළ ලේඛන සේ සළකා අදාළ නිර්ණායක අනුව ලකුණු ලබා දිය යුතු ය.

**7.2.4** **පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව**

දැනට පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්න වූ, ළමයාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් නොමැත්තේ නම්, උපරිම ලකුණු ලබා දිය යුතු ය. ඉල්ලුම් කරන පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න වූ, ළමයාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් පිහිටා ඇත්නම් උපරිම ලකුණු ප්‍රමාණයෙන් ආසන්න එක් එක් පාසලක් වෙනුවෙන් ලකුණු 05 බැගින් අඩු කළ යුතු ය.

(ළමයාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් යනුවෙන් අදහස් කරන්නේ එම ළමයාට ඇතුළත් වීමට හැකි ඉගෙනුම් මාධ්‍යය සහිත පාසලක් ද, තමන්ට අදාළ ගැහැණු හෝ පිරිමි පාසලක් ද, මිශ්‍ර පාසලක් ද යන්න සහ ළමයා අයිති ආගම වෙනුවෙන් 10% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කර ගන්නා රජයේ පාසල් වේ. එහෙත් ආගමික ප්‍රතිශතයක් සඳහන් නොවන පාසල් සඳහා ඕනෑම ආගමක සිසුන්ට ඇතුළත් වීමට හැකිය. )

**(උපරිම ලකුණු 50)**

**7.3 අදාළ පාසලේ ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවන් වන මව්පියන්ගේ ළමයින් - 25%**

මෙම ගණය යටතේ අදාළ පාසලේ ඉගෙනුම ලැබූ ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක වශයෙන් ළමයාගේ මව/පියා/නීත්‍යානුකූල භාරකරුට අයදුම් කළ හැකි ය. (ආදි ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක මිය ගිය ද ඔහුගේ/ඇයගේ ආදි ශිෂ්‍යභාවය අහෝසි නොවන බැවින්, ඔහු/ඇය වෙනුවෙන් ඉදිරිපත් කරන අයදුම්පත් ද සලකා බැලිය යුතු ය.)

පහත සඳහන් ලකුණු ක්‍රමයට අනුව මේ ගණය යටතේ ලකුණු ලබා දිය යුතු ය.

7.3.1 අයදුම්කරන ලද පාසලේ අධ්‍යාපනය ලැබූ කාලය සඳහා එක් ශ්‍රේණියකට ලකුණු 02 බැගින් (ශ්‍රේණියක නැවත රැඳීම වෙනුවෙන් ලකුණු ලබා නොදිය යුතු ය.)

**(උපරිම ලකුණු 26)**

7.3.2 අයදුම්කරන ලද පාසලේ ඉගෙනුම ලැබූ කාලය තුළ අයදුම්කරු විසින් ලබා ගත් අධ්‍යාපන ජයග්‍රහණ **(උපරිම ලකුණු 25)**

7.3.3 අයදුම්කරන ලද පාසලේ ඉගෙනුම ලැබූ කාලය තුළ අයදුම්කරු විසින් විෂය සමගාමී කටයුතුවලින් ලබාගත් ජයග්‍රහණ **(උපරිම ලකුණු 25)**

7.3.4 ආදි ශිෂ්‍ය සංගම් සාමාජිකත්වය, පාසල් කාලයෙන් පසු ලබා ඇති අධ්‍යාපන ජයග්‍රහණ හා පාසලේ දියුණුව සඳහා විදුහල්පති නිර්දේශ කරන කාර්යයන් සඳහා ලබාදුන් විවිධ ආකාරයේ සහයෝග (මෙහි දී පාසලේ දියුණුව සඳහා ලබා දුන් විවිධ ආකාරයේ සහයෝගය සඳහා ලබාදිය යුත්තේ උපරිම ලකුණු 06ක් පමණි)

**(උපරිම ලකුණු 24)**

7.3.5 උක්ත අංක 7.3.2 සිට 7.3.4 හි සඳහන් උපරිම ලකුණු, චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල ව, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියලු සාමාජිකයින්ගේ එකඟතාව පරිදි බෙදා වෙන් කර ගත හැකි ය. මේ පිළිබඳ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති විසින් පාසලේ ලොග් පොතේ සටහන් තැබිය යුතු අතර, තමාගේ වාර්තා පොතෙහි ද සටහන් කර තබා ගත යුතු ය.

7.3.6 ආදි ශිෂ්‍ය ගණය යටතේ ලබා දී ඇති ලකුණු බෙදා වෙන් කිරීම් කරන්නේ අදාළ පාසලේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වන බැවින් ලකුණු දීමේ පටිපාටිය අයදුම්කරුවන් නොදන්නා නිසා සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අවස්ථාවේ දී ඔවුන් දැනුම්වත් කළ යුතු ය. තවද 7.3.2 යටතේ ලකුණු ලබාදීමේදී 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාග ප්‍රතිපල තහවුරු කිරීම සඳහා ලේඛන ඉදිරිපත් කිරීමට අයදුම්කරුට ඇති හැකියාව සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම සුදුසු ය.

7.3.7 ද්විතියික පාසල් සංකල්පය යටතේ මව් පාසලින් ප්‍රාථමික අංශය වෙනම පාසලක් ලෙස වෙන් කර පවත්වා ගෙන යන අවස්ථාවක, එසේ වෙන් කරන ලද වර්ෂයේ සිට ද්විතියික පාසලේ 6 වන ශ්‍රේණියේ සිට ඉහළට ඉගෙනුම ලැබූ සිසුන් සහ ඒ වන විට ද්විතියික පාසල හැර ගොස් සිටි ආදි සිසුන් අදාළ ප්‍රාථමික පාසලේ ආදි සිසුන් ලෙස සැළකිය යුතුය.

## 7.4 දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහෝදර සහෝදරියන් - 14%

ළමයාගේ දෙමව්පියන්ගේ/නීත්‍යානුකූල භාරකරුගේ වැඩිමහල් ළමයින් දැනටමත් එම පාසලේ ඉගෙනුම ලබමින් සිටී නම් මෙම ගණය යටතේ අයදුම් කළ හැකි ය.
පහත සඳහන් ලකුණු ක්‍රමයට අනුව මෙම ගණය යටතේ ලකුණු ලබා දිය යුතු ය.

7.4.1 **පාසලේ සිටින සහෝදර/සහෝදරියන්**

7.4.1.1 අදාළ පාසලේ ඉගෙනුම ලබන සහෝදර/සහෝදරියන් ඉගෙනුම ලබන ලද එක් ශ්‍රේණියක් වෙනුවෙන් ලකුණු 02 බැගින් ලකුණු 20 (මේ සඳහා ලකුණු ලබා දීමේ දී පාසලේ ඉගෙනුම ලබන සහෝදර /සහෝදරියන් සංඛ්‍යාව කොපමණ වුව ද ලකුණු ලබා දිය යුත්තේ ඉන් එක් අයෙකු සඳහා පමණි.)

ලකුණු 20

7.4.1.2 අදාළ පාසලේ ඉගෙනුම ලබන ඉහත සඳහන් කළ සහෝදරයා/සහෝදරිය එම පාසලට පළමු ශ්‍රේණියට ඇතුළත්ව දැනට ඉගෙනුම ලබන්නේ නම්

ලකුණු 05

7.4.1.3 අදාළ පාසලේ සහෝදර/සහෝදරියන් දෙදෙනෙකු හෝ දෙදෙනෙකුට වඩා ඉගෙනුම ලබන්නේ නම් ලකුණු 05

7.4.1.4 පාසලේ සිටින සහෝදර/සහෝදරියන් පාසලට ලබා දී ඇති ජයග්‍රහණ හා පාසලේ දියුණුව සඳහා මව්පියන්/ නිත්‍යානුකූල භාරකරුවන් විසින් පාසලට දක්වන ලද විවිධාකාර සහයෝග (පාසලට දක්වන ලද විවිධාකාර සහයෝගය සඳහා ලබා දිය යුත්තේ උපරිම වශයෙන් ලකුණු 04 ක් පමණි.)

ලකුණු 10

**(උපරිම ලකුණු 40)**

7.4.2 **පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන**

මෙම ලේඛන අදාළ පුද්ගලයාගේ නමට පැවරී, අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දින සිට පූර්ව වර්ෂ 5ක කාලය සැලකිල්ලට ගෙන පහත ප්‍රතිශත අනුව ඊට හිමි ලකුණු ලබාදිය යුතු ය.

| | |
|---|---|
| වර්ෂ 05 ක් හෝ ඊට වැඩි | 100% |
| වර්ෂ 05 ට අඩු වර්ෂ 04 දක්වා | 80% |
| වර්ෂ 04 ට අඩු වර්ෂ 03 දක්වා | 60% |
| වර්ෂ 03 ට අඩු වර්ෂ 02 දක්වා | 40% |
| වර්ෂ 02 ට අඩු වර්ෂ 01 දක්වා | 20% |
| වර්ෂ 01 ට අඩු මාස 06 දක්වා | 10% |
| මාස 06 ට අඩු | 05% |

පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන ලෙස පහත ලේඛන පිළිගැනේ.

- ✓ සින්නක්කර ඔප්පු
- ✓ බිම්සවිය සහතිකය
- ✓ තෑගි ඔප්පු
- ✓ දීමනා පත්‍ර
- ✓ රජයේ ප්‍රදාන (හිමිකරු මිය ගොස් ඇත්නම් අයදුම්කරු/ කලත්‍රයා අනුප්‍රාප්තිකයකු ලෙස නම් කර තිබිය යුතු අතර, අදාළ බලධාරියා විසින් ඒ බව සනාථ කළයුතුය.)
- ✓ විහාර හා දේවාල ගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බද්ද ඔප්පු හෝ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් සහතික කරන ලද අදාළ විහාරාධිපති විසින් නිකුත් කරන සහතික
- ✓ පත් ඉරු මඟින් සනාථ කර ඇති වසර 10කට වැඩි කාලයක් සහිත ප්‍රකාශන ඔප්පු
- ✓ රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයකින් ගෙවීමේ පදනම මත මිල දී ගෙන, සම්පූර්ණ මුදලම ගෙවා අවසන් කර ඇති නමුත්, මෙතෙක් අදාළ ආයතන මඟින් එහි හිමිකරු වෙත එම දේපල පවරා නොමැති නිවාස (සම්පූර්ණ මුදලම ගෙවා අවසන් කරන ලද බවට අදාළ ආයතනයෙන් ලබාගත් ලිඛිත තහවුරුවක් ඉදිරිපත් කළ යුතුය.)

(සින්නක්කර ඔප්පු හා තෑගි ඔප්පු ප්‍රකාශන ඔප්පුවකින් ලියා ඇත්නම් එම ප්‍රකාශන ඔප්පුව වසර 10ක් හෝ ඊට වැඩි කාලයක් ලියාපදිංචි වී තිබිය යුතුය. එසේ නොමැති නම් ප්‍රකාශන ඔප්පුව ලියා පදිංචි කර ඇති දිනට පෙර වසර 10 කට වැඩි කාලයක් පදිංචිව සිටි බවට ලේඛන මඟින් තහවුරු කළ යුතු ය.)

I. පදිංචි ස්ථානයේ හිමිකම ඔප්පු කිරීමට ඉදිරිපත් කරනු ලබන ඉහත ලේඛන ඉල්ලුම්කරුගේ/කලත්‍රයාගේ නමට ඇත්නම් - **ලකුණු 10**

II. ඉල්ලුම්කරුගේ/කලත්‍රයාගේ මවගේ හෝ පියාගේ නමට හිමිකම ඇත්නම් - **ලකුණු 06**

පාසලට ඇතුළත් කිරීමට නියමිත ළමයාගේ හෝ එම ළමයාගේ අවිවාහක සහෝදරයෙකුට /සහෝදරියකට හිමිකම පවරා ඇති අවස්ථාවලදී අයදුම්කරුගේ නමට හිමිකම ඇති ලෙස සලකා ලකුණු ලබා දිය යුතු ය.

අදාළ වර්ෂ 5ක කාලය තුළ අයදුම්කරුගේ හෝ කලත්‍රයාගේ මව/පියා නමින් පැවති හිමිකම අයදුම්කරු හෝ කලත්‍රයා වෙත පවරා ඇත්නම්, ඒ ඒ පාර්ශ්ව වෙත හිමිකම පැවති කාලච්ඡේද දෙකම සැළකිල්ලට ගෙන, සම්පූර්ණ කාලසීමාව ආවරණය වන පරිදි අනුපාතිකව ලකුණු ලබා දිය යුතු ය.

(ඉහත පාර්ශ්ව හැර හිමිකම අනෙකුත් අයගේ නමට ඇත්නම් මෙම ලකුණු ලබා නොදිය යුතු ය. අවශ්‍ය වන්නේ නම් පත්ඉරු හා දෙවන පිටපත් පරීක්ෂා කර හිමිකම තහවුරු කරගත යුතු ය.)

- ✓ අයදුම්කරුගේ/කලත්‍රයාගේ නමින් පමණක් ඇති අඛණ්ඩ ව ලියාපදිංචි කළ බදු ඔප්පුව (අවශ්‍ය වන්නේ නම් බදු දීමනාකරුගේ අයිතිය සම්බන්ධව පත්ඉරු මඟින් සනාථ කළ යුතුය.) මේ යටතේ ලකුණු උපයාගැනීමට නම් බදු ඔප්පුව අවම වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දිනට පෙර ලියාපදිංචි කර තිබිය යුතු අතර, එය අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දින සිට ඉදිරි වර්ෂයක කාලයක් සඳහා වලංගු විය යුතු ය. අදාළ දේපල/නිවස සඳහා වෙනම වරිපනම් අංකයක්/ගෘහ අංකයක් තිබිය යුතු ය. - ලකුණු 04

(ලියාපදිංචි බදු ඔප්පුවක් ප්‍රකාශන ඔප්පුවකින් ලියා ඇත්නම් එම ප්‍රකාශන ඔප්පුව වසර 10ක් හෝ ඊට වැඩි කාලයක් ලියාපදිංචි වී තිබිය යුතු ය.)

අදාළ වර්ෂ 05ක කාලය තුල ලියාපදිංචි බදු ඔප්පු හිමියකු, එම දේපලේ හිමිකරුවකු බවට පත්ව ඇත්නම්, ඒ ඒ කාලච්ඡේද වෙන වෙනම සැළකිල්ලට ගෙන අදාළ ප්‍රතිශත අනුව ලකුණු ලබා දිය යුතු ය. මෙහි දී එම ස්ථානයේ අදාළ පුද්ගලයාගේ පදිංචිය, අඛණ්ඩ ව තිබිය යුතු ය.

- ✓ අයදුම්කරුගේ /කලත්‍රයාගේ නමින් පමණක් ඇති රජයේ නිල නිවාස ලේඛනය(දෙපාර්තමේන්තු ප්‍රධානිගේ තහවුරු කිරීමේ ලිපිය). තනිකඩ නිල නිවාසවල පදිංචිකරුවන් අදාළ කර නොගත යුතු ය. - ලකුණු 04
- ✓ අයදුම්කරුගේ /කලත්‍රයාගේ නමින් පමණක් ඇති ගෙවල් කුලී පනත යටතේ ලියාපදිංචි වී කුලී නිවැසියන් බව සනාථ කරනු ලබන ලේඛන - ලකුණු 04
- ✓ අයදුම්කරුගේ/කලත්‍රයාගේ නමින් පමණක් ඇති, රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයකින් ගෙවීමේ පදනම මත මිල දී ගෙන ඇති එහෙත්, ගෙවීම අවසන් කර නොමැති නිවාස ලේඛන (රජයේ/අර්ධ රාජ්‍ය ආයතනයක් සමඟ ඇති කර ගත් විකුණුම් ගිවිසුම් සම්බන්ධයෙන් එම ගිවිසුම හා ගෙවීම් කරන ලද ලදුපත් ද , ඉදිරිපත් කළ යුතුය.) - ලකුණු 04
- ✓ අයදුම්කරු/කලත්‍රයා අඛණ්ඩ ව වසර 10කට වඩා වැඩි කාලයක් රජයේ ඉඩමක (අදාළ ලිපිනයේ) පදිංචි බවට අදාළ ප්‍රදේශයේ නාගරික කොමසාරිස් /ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන සහතික (අදාළ සහතිකය අනෙකුත් අයගේ නමට ඇත්නම් මෙම ලකුණු ලබා නොදිය යුතු ය.) - ලකුණු 04

- ✓ අයදුම්කරු/කලත්‍රයා වතු ආශ්‍රිත නිවාසවල පදිංචිව සිටී නම් අදාළ වතු අධිකාරී සහ අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන සහතික - ලකුණු 04

- ✓ වෙනත් පිළිගත හැකි ලේඛන - ලකුණු 02

පදිංචි ස්ථානයට අදාළව ඉහත දක්වා ඇති ලේඛන නොමැති නමුත්, අයදුම්කරු/ කලත්‍රයා අදාළ ලිපිනයේ අඛණ්ඩ ව ස්ථිර පදිංචිකරුවකු නම්, අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දින වන විට පූර්වාසන්න වර්ෂ 06ක් හෝ ඊට වැඩි කාලයක් වූ, පදිංචි ලිපිනය සනාථ කෙරෙන පහත ලේඛන 04ක් සඳහා එක් ලේඛනයකට අයදුම්කරු/කලත්‍රයා නමින් නම් ලකුණු 0.5 බැගින් හෝ අයදුම්කරු/ කලත්‍රයාගේ මවගේ හෝ පියාගේ නමින් නම් ලකුණු 0.25 බැගින් ද ලබා දිය යුතු ය.

විදුලි බිල්පත්, ජල බිල්පත්, වරිපනම් බදු බිල්පත්, අක්කර බදු බිල්පත්, අයදුම්කරු/ කලත්‍රයාගේ උප්පැන්න සහතික

ඉහත ලේඛන අනිවාර්යයෙන්ම පූර්වාසන්න වර්ෂ 06කට හෝ ඊට වැඩි කාලයකට අදාළ විය යුතු අතර, එම ලේඛන වලින් අවම වශයෙන් තුනක්වත් තිබේ නම් පමණක් මේ සඳහා ලකුණු ලබා දිය යුතුය.

අදාළ වර්ෂ 06ක කාලය තුළ අයදුම්කරුගේ හෝ කලත්‍රයාගේ මව/පියා නමින් ගෙවන ලද බිල්පත් පසුව අයදුම්කරු හෝ කලත්‍රයා නමින් ගෙවා ඇත්නම්, ඒ ඒ පාර්ශ්ව විසින් බිල්පත් ගෙවන ලද කාලච්ඡේද දෙකම සැළකිල්ලට ගෙන, ලකුණු ලබා දිය යුතු ය.

- ✓ රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයක් සතු දේපලක (ඉල්ලුම් කරන ලද ස්ථානය) උපන්දා සිට පදිංචිව සිටින නමුත්, එම දේපල සඳහා පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනයක් නොමැති අවස්ථාවකදී, එහෙත් කිසිදු ආසන්න පාසලක් සඳහා ලකුණු නොකැපෙන, අයදුම්කරු/කලත්‍රයා ට අදාළ ලිපිනයෙහි පූර්වාසන්න වර්ෂ 5ක ඡන්ද ලියාපදිංචිය ඇති, උපන්දා සිට අයදුම්කරු/කලත්‍රයා අදාළ ස්ථානයේ පදිංචි බවට තහවුරු කළ හැකි (උප්පැන්න සහතිකය, අස්වීම් සහතිකය.......ආදිය මඟින්) විවාහයෙන් පසු ද මේ දක්වා ඉල්ලුම් කරන ලිපිනයේ ම පදිංචිව සිටින බවට තහවුරු කරන අයදුම්කරුවන්ට (එම දේපල රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයක් සතු දේපලක් වන බවටත්, අයදුම්කරු එම දේපලෙහි උපන්දා සිට පදිංචිව සිටින බවටත්, ආදාල ආයතන මඟින් කරන ලද තහවුරුවක් අයදුම්කරු විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය). - ලකුණු 06

මෙහිදී, ඉහත කරුණු පාසල් සම්මුඛ පරීක්ෂණ කමිටුව විසින් විධිමත් ව පරීක්ෂා කර නිසි පරිදි තහවුරු කරගෙන ලකුණු ලබා දිය යුතු අතර වෙනම ලේඛනයක එම අයදුම්කරුවන්ගේ තොරතුරු සටහන් කර තබාගත යුතු ය. එසේ ම, මේ සම්බන්ධව ලොග් සටහන් ද තබාගත යුතු ය.

- ✓ වතු අධිකාරීවරයෙකු යටතේ පාලනය වන වතුවල කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සේවකයින් පදිංචි කර ඇති විට, ඉහත පදිංචිය තහවුරු කරන කිසිදු අවස්ථාවක් යටතේ සුදුසුකම් සපුරා නොමැති නම්, වතු අධිකාරී විසින් වතු ආශ්‍රිත නිවාසවල පදිංචිය තහවුරු කිරීම සඳහා නිකුත් කර ඇති ලිපිය ග්‍රාම නිලධාරී විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර ඇති අවස්ථාවකදී වෙනත් කිසිදු පාසලකට ලකුණු නොකැපෙන්නේ නම් පමණක්, එවැනි පදිංචිකරුවන් සඳහා - ලකුණු 06

**(උපරිම ලකුණු 10)**

**“මෙම ගණය යටතේ ඉහත කරුණුවලට අදාල ව පදිංචිය තහවුරු කිරීම සඳහා හිමිවන ලකුණු උපයා ඇති අයදුම්කරුවන්ට පමණක් මින් ඉදිරියට ඇති කොටස් සඳහා ලකුණු ලබා දිය යුතු ය.”**

**7.4.3 පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිය**

ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී ඇති බව සටහන් කිරීමට අයදුම්පතෙහි ලබා දී ඇති කොටස (අංක 06) සම්පූර්ණ කර ලියාපදිංචිය සනාථ කළ යුතු ය.

7.4.3.1 ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචියට ලකුණු ලබා දීමේ දී අයදුම්කරන වර්ෂයට පෙර වර්ෂයේ සිට ආසන්න වර්ෂ 05 ක් සළකා බලනු ලැබේ.

ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිය සඳහා පහත පරිදි ලකුණු ලබා දිය යුතු ය.

වගු අංක - (II) **ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචිය සඳහා ලකුණු ලබා දීම**

| | **විස්තරය** | **ලකුණු** |
|---|---|---|
| (i) | මව හා පියා යන දෙදෙනාගේ /නීත්‍යානුකූල භාරකරුගේ නම වර්ෂ 05ක් ලියාපදිංචි වී තිබේ නම් | 20 |
| (ii) | මව/පියාගේ නම වර්ෂ 5ක්ද කලත්‍රයාගේ නම ඕනෑම වර්ෂ 04ක් ද ලියාපදිංචි වී තිබේ නම් | 18 |
| (iii) | මව/පියාගේ නම වර්ෂ 5ක්ද කලත්‍රයාගේ නම ඕනෑම වර්ෂ 03ක් ද ලියාපදිංචි වී තිබේ නම් | 16 |
| (iv) | මව /පියාගේ නම වර්ෂ 05ක් ද කලත්‍රයාගේ නම ඕනෑම වර්ෂ 02ක් ද ලියාපදිංචි වී තිබේ නම් | 14 |
| (v) | මව/පියාගේ නම වර්ෂ 05ක් ද කලත්‍රයාගේ ගේ නම ඕනෑම වර්ෂයක් ද ලියාපදිංචි වී තිබේ නම් | 12 |
| (vi) | මව / පියාගේ නම පමණක් වර්ෂ 05ක් ලියාපදිංචි වී තිබේ නම් | 10 |

එක් අයෙකුට එක් වර්ෂයකට ලකුණු 02 බැගින් ලබා දී ඉහත ලකුණු ක්‍රමය සකස් කර ඇත. එම නිසා ඉහත ලකුණු ක්‍රමයෙන් ආවරණය නොවන අවස්ථාවන්හි දී ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වී සිටින කාලයටම එක් අයෙකුට ලකුණු 02 බැගින් වන සේ ලකුණු ලබා දිය යුතු ය.

නීත්‍යානුකූල භාරකරු මව හා පියා යන දෙදෙනාම සේ සලකනු ලබන බැවින්, මව හා පියා යන දෙදෙනාටම ලියාපදිංචි වර්ෂයකට හිමිවන ලකුණු (එනම් වර්ෂයකට ලකුණු 04ක්) නීත්‍යානුකූල භාරකරුට ලබා දිය යුතු ය.

**(උපරිම ලකුණු 20)**

7.4.3.2 පෙර වර්ෂවල ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වී සිටි ඉල්ලුම්කරුගේ කලත්‍රයා විදේශගත වී සිටී නම් හෝ මිය ගොස් ඇත්නම් හෝ නීත්‍යානුකූලව දික්කසාද වී ඇත්නම් හෝ අදාළ ලේඛන පරීක්ෂා කර දෙදෙනා ම සිටින සේ සලකා ලකුණු ලබා දිය යුතු ය.

7.4.3.3 පදිංචිය සඳහා ලකුණු ලබා දෙන්නේ දැනට පදිංචි වී සිටින ස්ථානයේ ලිපිලේඛන මඟිනි. එහෙත් දැනට පදිංචි වී සිටින ස්ථානයේ පදිංචි වීමට පෙර පෝෂිත ප්‍රදේශය තුළ තවත් ස්ථානයක පදිංචි වී සිටි (පෙර පදිංචි ස්ථානය 7.4.2හි සඳහන් ලේඛන මඟින් සනාථ කළ යුතුය.) අයදුම්කරුවකු, තම අවම වසර 05ක පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛන ස්ථාන දෙකෙන් ම ඉදිරිපත් කරන විට, එම ස්ථාන දෙකෙහිදීම ඉල්ලුම්කරනු ලබන පාසලට වඩා ආසන්නව පිහිටි ළමයාට ඇතුළත් විය හැකි පාසල්, එකම

පාසල් වන්නේ නම් පමණක් ස්ථාන දෙකෙන් ම ඉදිරිපත් කර ඇති ඡන්ද හිමි නාමලේඛන, දැනට පදිංචි ස්ථානයේ ඡන්ද හිමි නාමලේඛන සේ සලකා ලකුණු ලබා දිය යුතු ය.

7.4.4 අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දින සිට පූර්වාසන්න වර්ෂ පහක් තුළ ක්‍රියාත්මක වූ රජයේ සංවර්ධන ව්‍යාපෘති හෝ සංවර්ධන යෝජනා ක්‍රම හේතුවෙන්, යම් ප්‍රදේශයක පදිංචිකරුවන් එම ප්‍රදේශවලින් ඉවත් කොට වෙනත් ප්‍රදේශයක පදිංචි කරවා ඇති අවස්ථාවක හෝ රජයේ ඉහත සංවර්ධන කටයුතු හේතුවෙන් අවතැන් වූ පදිංචිකරුවන් විසින් රජයෙන් වන්දි මුදල් ලබාගෙන වෙනත් ප්‍රදේශයක ස්ථිරව පදිංචි වී ඇති අවස්ථාවක, ඔවුන්ගේ ළමයින් පාසල්වල පළමුවන ශ්‍රේණියට ඇතුළත් කිරීමේදී පෙර සහ වර්තමාන පදිංචියට අදාළව ස්ථාන දෙකෙන්ම ඉදිරිපත් කර ඇති ලේඛන, එකම ස්ථානයකට අදාළ ලේඛන සේ සළකා අදාළ නිර්ණායක අනුව ලකුණු ලබා දිය යුතු ය.

7.4.5 **පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව**

දැනට පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්න වූ, ළමයාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් නොමැත්තේ නම්, උපරිම ලකුණු ලබා දිය යුතු ය. ඉල්ලුම් කරන පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්නවූ, ළමයාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් පිහිටා ඇත්නම් උපරිම ලකුණු ප්‍රමාණයෙන් ආසන්න එක් එක් පාසලක් වෙනුවෙන් ලකුණු **03** බැගින් අඩු කළ යුතු ය.

(ළමයාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් යනුවෙන් අදහස් කරන්නේ එම ළමයාට ඇතුළත් වීමට හැකි ඉගෙනුම් මාධ්‍යය සහිත පාසලක් ද, තමන්ට අදාළ ගැහැණු හෝ පිරිමි පාසලක් ද, මිශ්‍ර පාසලක් ද යන්න සහ, ළමයා අයිති ආගම වෙනුවෙන් 10% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කර ගන්නා රජයේ පාසල් වේ. එහෙත් ආගමික ප්‍රතිශතයක් සඳහන් නොවන පාසල් සඳහා ඕනෑම ආගමක සිසුන්ට ඇතුළත් වීමට හැකිය.) **(උපරිම ලකුණු 30)**

### 7.5 අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපන අංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුව ම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ ළමයින් - 06%

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපන අංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජු ව ම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයේ ස්ථිර තනතුරක, මව/ පියා/ නීත්‍යානුකූල භාරකරු අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දිනට සේවයේ නියුක්ත ව සිටී නම් පමණක් මෙම ගණයට ඉල්ලුම් කළ හැකි අතර, උක්ත දිනට වැටුප් රහිත විදේශ නිවාඩු ලබා සිටී නම් මෙම ගණය යටතේ ඉල්ලුම් කිරීමට නොහැක. (මව/ පියා දෙදෙනා ම මෙම ගණය යටතේ සුදුසුකම් ලබන්නේ නම් ලකුණු වැඩියෙන් ලබා ගත හැකි තැනැත්තාගේ ලකුණු පමණක් සැලකිල්ලට ගත යුතු ය).

7.4.2 හි සඳහන් ලේඛන මගින් පදිංචිය සනාථ වන්නේ නම් පමණක් පහත සඳහන් ලකුණු ක්‍රමයට අනුව මෙම ගණය යටතේ ලකුණු ලබා දිය යුතුය.

7.5.1 අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපන අංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුව ම බලපාන ආයතනයන් හි කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවකයකු ලෙස සේවා කාලය පූර්ණ වර්ෂයකට ලකුණු 1 බැගින්

**(උපරිම ලකුණු 20)**

7.5.2 ඉල්ලුම්කරු සේවය කර ඇති පාසල අදාළ කාල සීමාවේ දී, මෙම අමාත්‍යාංශයේ චක්‍රලේඛ අනුව, අති දුෂ්කර හා දුෂ්කර ලෙස වර්ග කරනු ලැබූ පාසලක් බවට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කළ යුතු ය (7.5.2.1 සහ 7.5.2.2 හි I ට පමණක් අදාළ වේ.)

7.5.2.1 දැනට දුෂ්කර පාසලක සේවයේ යෙදේ නම් දුෂ්කර සේවා කාලය (මෙම කාලය අඛණ්ඩ ව තිබිය යුතු ය.) පූර්ණ වසරකට ලකුණු 05 බැගින් ලකුණු 25

7.5.2.2

I. දැනට දුෂ්කර පාසලක සේවයේ නොයෙදෙන නමුත් මීට පෙර දුෂ්කර සේවයේ යෙදුණේ නම් සේවා කාලය පූර්ණ වසරකට ලකුණු 03 බැගින් ලකුණු 15
(දුෂ්කර පාසලක සේවයේ යෙදුන/යෙදෙන කාලසීමාව තුල යම් පහසු පාසලකට අනුයුක්තයක් ලබා ඇත්නම්, එම අනුයුක්ත කාලසීමාව දුෂ්කර සේවා කාලය ගණනය කිරීමේදී සලකා බලනු නොලැබේ.)

හෝ

II. මුල් පත්වීම ලැබූ සේවා ස්ථානයේ සිට කි.මී.75 හෝ ඊට වැඩි දුරකින් ස්ථිර පදිංචි ස්ථානය පිහිටියේ නම්, (වර්තමානයේ පවතින මාර්ග පද්ධතිය යටතේ කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය ගණනය කළ යුතු ය. ඒ සඳහා පිළිගනු ලබන ලේඛන සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පූර්වයෙන් තීරණය කර ඒ පිළිබඳව දැනුවත් කිරීමේ රැස්වීමේදී අයදුම්කරුවන් දැනුවත් කර ඒ බවට ලොග් සටහන් තබා තිබිය යුතු ය.)

\- ලකුණු 15

කි.මී. 150 හෝ ඊට වැඩි නම් වසරකට ලකුණු 03 බැගින් - ලකුණු 15
කි.මී. 150 ට අඩු කි.මී. 100 වැඩි නම් වසරකට ලකුණු 02 බැගින් - ලකුණු 10
කි.මී. 100 ට අඩු කි.මී. 75 වැඩි නම් වසරකට ලකුණු 01 බැගින් - ලකුණු 05

මෙහිදී මුල් පත්වීම ලැබූ සේවා ස්ථානයේ සේවයේ යෙදුන කාලසීමාව තුල ස්ථිර පදිංචි ස්ථානයේ සිට කි.මී.75 හෝ ඊට අඩු දුරකට අනුයුක්තයක් ලබා ඇත්නම්, එම අනුයුක්ත කාලසීමාවන් සලකා බලනු නොලැබේ.

(පත්වීම් ලිපිය ඇතුළුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පූර්වයෙන් තීරණය කර, ඒ පිළිබඳව දැනුවත් කිරීමේ රැස්වීමේදී අයදුම්කරුවන් දැනුවත් කර ලොග් සටහන් යෙදූ ග්‍රාම සේවා සහතිකය/විවාහ සහතිකය/ඡන්ද හිමි නාමලේඛනය/යනාදී ලේඛන වලින් එක් ලේඛනයක් මඟින් පදිංචිය සනාථ කර ගත යුතු ය.)

7.5.2. යටතේ උපයාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 25ක් වන අතර, ඉහත I හා II අතරින් වැඩිම ලකුණු හිමිවන නිර්ණායකය අදාළ කර ගත යුතු ය. II සඳහා ලකුණු ලබා දීමේදී ගැටලුකාරී අවස්ථා මතුවන්නේ නම් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සුදුසු පරිදි තීරණ ගත හැකි ය.

**(උපරිම ලකුණු 25)**

7.5.2.3 අවම වශයෙන් වසරකට වඩා වැඩි දුෂ්කර සේවා කාලයක් සපුරා ඇති අයට පමණක් පූර්ණ වසරකට වඩා වැඩි වන මාස 06ක් හෝ ඊට වැඩි වන මාස ගණනට අදාළ ලකුණෙන් භාගයක් ලබා දිය යුතු ය.

7.5.3 **ලබා නොගත් නිවාඩු**

අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයට පෙර වසර 05ක් සඳහා එක් එක් ලිත් වර්ෂයක් තුළ ලබා නොගත් නිවාඩු දින 20ක් සඳහා එක් වර්ෂයකට ලකුණු 02 බැගින් ලබා දිය යුතුය. වර්ෂයකදී ලබා නොගත් නිවාඩු දින සංඛ්‍යාව 20 ට වඩා අඩු නම් ලකුණු ලබා නොදිය යුතු ය. මෙහි දී වැටුප් සහිත ප්‍රසූත නිවාඩුවෙන් පසු ලබා ගන්නා අඩ වැටුප් නිවාඩු, වැටුප් රහිත නිවාඩු ලබා තිබේ නම් පුද්ගලයකුට හිමි සාමාන්‍ය නිවාඩුවලින් (අනියම් හා අසනීප/විවේක) එය අඩු කළ යුතු ය.

**(උපරිම ලකුණු 10)**

7.5.4 **පාසල් අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනයක සේවය කිරීම**

- ළමයා ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන පාසලේ ම ස්ථිර සේවයේ යෙදෙන්නේ නම්,සේවා කාලය වර්ෂයකට ලකුණු 2 බැගින් වර්ෂ 5 ක් සඳහා - ලකුණු 10
- පාසල අයත් අධ්‍යාපන කලාපය තුළ පාසලක, පාසල අයත් කොට්ඨාස හෝ කලාප කාර්යාලයේ කාර්යමණ්ඩලයේ ස්ථිර සේවයේ නියුතු නිලධාරියකු නම් සේවා කාලය වර්ෂයකට ලකුණු 1.5 බැගින් වර්ෂ 5 ක් සඳහා - ලකුණු 7.5
- පාසල අයත් පළාත තුළ පාසලක, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ/අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපන අංශයේ කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවයේ නියුතු නිලධාරියකු නම් සේවා කාලය වර්ෂයකට ලකුණු 1 බැගින් වර්ෂ 5 ක් සඳහා - ලකුණු 5
- මෙම ගණය යටතේ සලකා බලනු ලබන රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුව බලපාන අනෙකුත් ආයතනයක ස්ථිර සේවයේ නියුතු නිලධාරියකු නම් සේවා කාලය වර්ෂයකට ලකුණු 0.5 බැගින් වර්ෂ 5 ක් සඳහා - ලකුණු 2.5

**(උපරිම ලකුණු 10)**

7.5.5 වර්තමාන ස්ථිර පදිංචි ස්ථානයේ සිට ළමයා ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් කරනු ලබන පාසලට ඇති දුර (කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය ගණනය කළ යුතු ය. ඒ සඳහා පිළිගනු ලබන ලේඛන සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පූර්වයෙන් තීරණය කර ඒ පිළිබඳව දැනුවත් කිරීමේ රැස්වීමේදී අයදුම්කරුවන් දැනුවත් කර ලොග් සටහන් තබා තිබිය යුතු ය.)

| | | |
|---|---|---|
| කි.මී. 01ක් ඇතුළත නම් | - | ලකුණු 10 |
| කි.මී. 01 ට වැඩි කි.මී. 03 දක්වා | - | ලකුණු 08 |
| කි.මී. 03 ට වැඩි කි.මී. 05 දක්වා | - | ලකුණු 06 |
| කි.මී. 05ට වැඩි නම් | - | ලකුණු 04 |

**(උපරිම ලකුණු 10)**

7.5.6 වර්තමාන සේවා ස්ථානයේ සිට ළමයා ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් කරනු ලබන පාසලට ඇති දුර (කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය ගණනය කළ යුතු ය. ඒ සඳහා පිළිගනු ලබන ලේඛන සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පූර්වයෙන් තීරණය කර ඒ පිළිබඳව දැනුවත් කිරීමේ රැස්වීමේදී අයදුම්කරුවන් දැනුවත් කර ලොග් සටහන් තබා තිබිය යුතු ය.)

| | |
|---|---|
| කි.මී. 100 හා ඊට වැඩි නම් | - ලකුණු 25 |
| කි.මී. 100ට අඩු කි.මී.70 දක්වා | - ලකුණු 20 |
| කි.මී. 70 ට අඩු කි.මී. 40 දක්වා | - ලකුණු 15 |
| කි.මී. 40 ට අඩු කි.මී.20 දක්වා | - ලකුණු 10 |
| කි.මී. 20 ට අඩු නම් | - ලකුණු 05 |

(අයදුම්කරු ඉල්ලුම්කරනු ලබන පාසලේම සේවය කරන්නේ නම්, අවම ලකුණ වන ලකුණු 05 ලබාදිය යුතු ය.) **(උපරිම ලකුණු 25)**

**7.6 රජයේ සේවා අවශ්‍යතා මත හෝ රජයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබූ රාජ්‍ය/සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/රාජ්‍ය බැංකු නිලධරයන්ගේ ළමයින් - 04%**

මෙම ගණය යටතේ රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරු වීම් ලැබූ හෝ රජයේ වාර්ෂික ස්ථානමාරුවීම් ලැබූ රජයේ/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකුවල නිලධාරීන්ට, අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දිනට පෙර වසර 05ක කාලයක් ඇතුළත පාසල පිහිටි ප්‍රදේශය තුළ ස්ථාපිත ආයතනයකට ස්ථාන මාරුවීම් ලැබ රාජකාරී භාරගැනීමෙන් පසුව පාසලේ පෝෂිත ප්‍රදේශය තුළ පදිංචි ව සිටින්නේ නම් පමණක් ඉල්ලුම් කළ හැකි ය. මෙහි දී පාසල පිහිටි ප්‍රදේශය යනුවෙන් අදහස් වන්නේ අදාළ පාසල කේන්ද්‍රය කර, කිලෝමීටර් 10ක් අරය ලෙස ගෙන අඳින වෘත්තයක සීමාව තුළ අදාළ ආයතනය පිහිටා තිබීම වේ.(අදාළ සීමාව තුළ ප්‍රමාණවත් අයදුම්පත් ලැබී නොමැති අවස්ථාවක පමණක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට මෙම සීමාව වැඩි කර ගත හැකි ය.) එමෙන් ම පෙර සේවා ස්ථානය පිහිටා ඇති ප්‍රදේශයේ කලත්‍රයා හා ළමයාද සමඟ පදිංචි ව සිට, නව සේවා ස්ථානයට අදාළව පදිංචි ස්ථානයට කලත්‍රයා හා ළමයා සමඟ පැමිණිය යුතු ය. (ඒ බව සනාථ කිරීමට පිළිගනු ලබන ලේඛන සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පූර්වයෙන් තීරණය කර ඒ පිළිබඳව දැනුවත් කිරීමේ රැස්වීමේදී අයදුම්කරුවන් දැනුවත් කර ඒ බවට ලොග් සටහන් තබා තිබිය යුතු ය.)

තව ද අවසානයට ලද ස්ථාන මාරුව පමණක් සලකා බැලිය යුතු අතර, අනුයුක්ත කිරීම්, පුහුණු පාඨමාලා හා අධ්‍යයන කටයුතු සඳහා පදිංචිය වෙනස් කිරීම් ආදිය මේ යටතේ සලකා බලනු නොලැබේ. පෙර සේවා ස්ථානය හා නව සේවා ස්ථානය අතර අවම දුර කි.මී.50ක් විය යුතු අතර, **අවම වශයෙන් වසරක්වත් පෙර සේවා ස්ථානයේ සේවය කර තිබිය යුතු ය.**

7.4.2 හි සඳහන් ලේඛන මඟින් පදිංචිය සනාථ වන්නේ නම් පමණක් පහත සඳහන් ලකුණු ක්‍රමයට අනුව මෙම ගණය යටතේ ලකුණු ලබා දිය යුතුය.

7.6.1 **පෙර සේවා ස්ථානයේ සිට ස්ථාන මාරුවීම් ලබා පැමිණ ඇති නව සේවා ස්ථානය අතර දුර** (කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය ගණනය කළ යුතු ය. ඒ සඳහා පිළිගනු ලබන ලේඛන සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පූර්වයෙන් තීරණය කර ඒ පිළිබඳව දැනුවත් කිරීමේ රැස්වීමේදී අයදුම්කරුවන් දැනුවත් කර ඒ බවට ලොග් සටහන් තබා තිබිය යුතු ය.)

| | | |
|---|---|---|
| කි.මී. 150 හා ඊට වැඩි නම් | - | ලකුණු 35 |
| කි.මී. 150 ට අඩු කි.මී. 100 දක්වා | - | ලකුණු 28 |
| කි.මී. 100 ට අඩු කි.මී. 50 දක්වා | - | ලකුණු 21 |

**(උපරිම ලකුණු 35)**

7.6.2 **ස්ථාන මාරු වීම් ලැබ පැමිණ පදිංචි වූ ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව**

දැනට පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්න වූ, ළමයාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් නොමැත්තේ නම්, උපරිම ලකුණු ලබා දිය යුතු ය. ඉල්ලුම් කරන පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්නවූ, ළමයාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් පිහිටා ඇත්නම් උපරිම ලකුණු ප්‍රමාණයෙන් ආසන්න එක් එක් පාසලක් වෙනුවෙන් ලකුණු **03** බැගින් අඩු කළ යුතු ය.

(ළමයාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් යනුවෙන් අදහස් කරන්නේ එම ළමයාට ඇතුළත් වීමට හැකි ඉගෙනුම් මාධ්‍යය සහිත පාසලක් ද,

තමන්ට අදාළ ගැහැණු හෝ පිරිමි පාසලක් ද, මිශ්‍ර පාසලක් ද යන්න සහ ළමයා අයිති ආගම වෙනුවෙන් 10% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කර ගන්නා රජයේ පාසල් වේ. එහෙත් ආගමික ප්‍රතිශතයක් සඳහන් නොවන පාසල් සඳහා ඕනෑම ආගමක සිසුන්ට ඇතුළත්වීමට හැකිය.)

**(උපරිම ලකුණු 30)**

7.6.3 රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල/රාජ්‍ය බැංකු සේවකයෙකු ලෙස සේවා කාලය වසරකට එක් ලකුණක් බැගින් ලකුණු 10

**(උපරිම ලකුණු 10)**

7.6.4 **පෙර සේවා ස්ථානයේ සේවය කල කාලය**

| | | |
|---|---|---|
| වර්ෂ 3 හෝ ඊට වැඩි | - | ලකුණු 10 |
| වර්ෂ 2 සිට වර්ෂ 3ට අඩු | - | ලකුණු 08 |
| වර්ෂ 1 සිට වර්ෂ 2ට අඩු | - | ලකුණු 05 |

**(උපරිම ලකුණු 10)**

7.6.5 **ස්ථාන මාරුවීම් ලැබ ගත වූ කාලය (**අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 දිනට**)**

| | | |
|---|---|---|
| වර්ෂයක කාලයක් තුළ නම් | - | ලකුණු 05 |
| වර්ෂයකට වැඩි වර්ෂ 2 දක්වා කාලයක් තුළ නම් | - | ලකුණු 04 |
| වර්ෂ 2 කට වැඩි වර්ෂ 3 දක්වා කාලයක් තුළ නම් | - | ලකුණු 03 |
| වර්ෂ 3 කට වැඩි වර්ෂ 4 දක්වා කාලයක් තුළ නම් | - | ලකුණු 02 |
| වර්ෂ 4 කට වැඩි වර්ෂ 5 දක්වා කාලයක් තුළ නම් | - | ලකුණු 01 |

**(උපරිම ලකුණු 05)**

7.6.6 **ලබා නොගත් නිවාඩු**

අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයට පෙර වසර 05ක් සඳහා එක් එක් ලිත් වර්ෂයක් තුළ ලබා නොගත් නිවාඩු දින 20ක් සඳහා එක් වර්ෂයකට ලකුණු 02 බැගින් ලබා දිය යුතුය. වර්ෂයකදී ලබා නොගත් නිවාඩු දින සංඛ්‍යාව 20 ට වඩා අඩු නම් ලකුණු ලබා නොදිය යුතු ය. මෙහි දී වැටුප් සහිත ප්‍රසූත නිවාඩුවෙන් පසු ලබා ගන්නා අඩ වැටුප් නිවාඩු, වැටුප් රහිත නිවාඩු ලබා තිබේ නම් පුද්ගලයකුට හිමි සාමාන්‍ය නිවාඩුවලින් (අනියම් හා අසනීප/විවේක) එය අඩු කළ යුතු ය.

**(උපරිම ලකුණු 10)**

**සැ.යු -** පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ **ජුනි 30 දිනට** පසු හෝ පළමුවන ශ්‍රේණිය ආරම්භ වීමෙන් පසු හෝ රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම් ලැබූ හෝ අදාළ ළමයා සමඟ විදේශගතව සිට පැමිණෙන නිලධරයන්ගේ ළමයින්ට හෝ පාසල් ලබා දීම සඳහා අදාළ පාසල අයත් වන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට ඔවුන් විසින් ඉල්ලුම්පත් යොමු කළ යුතු ය. මෙම මව්පියන්ගේ ළමයින් සඳහා අදාළ අධ්‍යාපන බලධාරීන් විසින් තීරණය කරන ලද පාසල් ලබා දෙනු ඇත. එම අය සඳහා ද ඉහත ලකුණු ක්‍රමය අදාළ කර ගත හැකි ය.

## 7.7 ළමයා සමඟ විදේශ රටක පදිංචි ව සිට පැමිණෙන තැනැත්තන්ගේ ළමයින් - 01%

මෙම ගණය යටතේ ඉල්ලුම්පත් භාර ගන්නා වර්ෂයට පෙර වර්ෂයේ ජූලි 01 වන දින සිට අයදුම්පත් ඉදිරිපත් කරන වර්ෂයේ ජුනි 30 දින දක්වා කාලය තුළ ළමයා සමග විදේශ රටක පදිංචිව සිට පැමිණි මව/පියා/නීත්‍යානුකූල භාරකරුට ඉල්ලුම් කළ හැකි ය. එසේම ඔවුන් අවම වශයෙන් අඛණ්ඩ ව වර්ෂයකට නොඅඩු කාලයක් විදේශගතව සිට පැමිණි අය විය යුතු ය.

7.4.2 හි සඳහන් ලේඛන මගින් පදිංචිය සනාථ වන්නේ නම් පමණක් පහත සඳහන් ලකුණු ක්‍රමයට අනුව මෙම ගණය යටතේ ලකුණු ලබා දිය යුතුය.

7.7.1 **දිවයිනට පැමිණි දිනය දක්වා ළමයා සමඟ විදේශ ගත වී සිටි කාලය**

| | |
|---|---|
| අඛණ්ඩ ව වසර 03 හෝ ඊට වැඩි කාලයක් | - ලකුණු 25 |
| අඛණ්ඩ ව වසර 03 ට අඩු වසර 02 ක් දක්වා කාලයක් | - ලකුණු 15 |
| අඛණ්ඩ ව වසර 02 ට අඩු වසර 01 දක්වා කාලයක් | - ලකුණු 10 |

**(උපරිම ලකුණු 25)**

(මෙම කාලය තුළ, මසකට අඩු කාලයක් නිවාඩු ලබා ලංකාවට පැමිණ නැවතත් අදාළ ස්ථානයට ගොස් ඇත්නම්, අඛණ්ඩ කාලයට එය බලපෑමක් නොවන බව සලකන්න. )

7.7.2 **විදේශගත වූ ස්වභාවය**

| | |
|---|---|
| ශ්‍රී ලංකා දූත මණ්ඩල රාජකාරි සඳහා | - ලකුණු 40 |
| පෞද්ගලික රැකියා අවශ්‍යතාවක් සඳහා (අවම වශයෙන් වසර 2ක් වත් විදේශ රැකියාවක නිරතව සිටි අය විය යුතුය.) | - ලකුණු 30 |
| ශ්‍රී ලංකා රජයේ අවශ්‍යතා සඳහා (රජය මගින් හෝ රජය වෙනුවෙන් විදේශයක රාජකාරියක් ඉටු කිරීම සඳහා පත් කළ පුද්ගලයන් සඳහා) | - ලකුණු 25 |
| ශිෂ්‍යත්වයක් සඳහා (නිරතවන රාජකාරියේ වෘත්තීය සංවර්ධනය සඳහා අවශ්‍ය වන) | - ලකුණු 20 |

**(උපරිම ලකුණු 40)**

7.7.3 **පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව**

පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්නවූ, අදාළ ළමයාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් නොමැත්තේ නම් උපරිම ලකුණු ලබා දිය යුතු ය. ඉල්ලුම් කරන පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්නවූ, ළමයාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශය සහිත වෙනත් රජයේ පාසල් පිහිටා ඇත්නම් උපරිම ලකුණු ප්‍රමාණයෙන් ආසන්න පාසලක් වෙනුවෙන් ලකුණු 3.5 බැගින් අඩු කළ යුතු ය.

(ළමයාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් යනුවෙන් අදහස් කරන්නේ, එම ළමයාට ඇතුළත් වීමට හැකි ඉගෙනුම් මාධ්‍ය සහිත පාසලක් ද, තමන්ට අදාළ ගැහැනු හෝ පිරිමි පාසලක් ද, මිශ්‍ර පාසලක් ද යන්න සහ අදාළ ළමයා අයිති ආගම වෙනුවෙන් 10% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කර ගන්නා රජයේ පාසල් වේ. එහෙත් ආගමික ප්‍රතිශතයක් සඳහන් නොවන පාසල් සඳහා ඕනෑම ආගමක සිසුන්ට ඇතුළත්වීමට හැකිය.)

**(උපරිම ලකුණු 35)**

## 8.0 අයදුම්පත් ලැබීමෙන් පසු ක්‍රියා පිළිවෙළ

8.1 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසු ව, සියලු ම අයදුම්පත් විදුහල්පතිවරයාගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ මාධ්‍ය අනුව පැහැදිලි ලෙස ලේඛනගත කළ යුතු ය. මෙහි දී ඉහත 7.2 සිට 7.7 දක්වා වූ උප වගන්තිවල සඳහන් ගණ අනුව වර්ගීකරණය කළ යුතු ය. ඉන්පසුව ලැබූ අයදුම්පත් සියල්ල ඒ ඒ ගණ

යටතේ අංක කර, සියළුම අයදුම්කරුවන් ඇතුළත් ලේඛනය (දරුවාගේ නම, අයදුම්කරුගේ නම සහ ලිපිනය සහිතව) පාසලේ දැන්වීම් පුවරුවේ සහ පාසල් වෙබ් අඩවියේ පළ කළ යුතු ය.

8.2 ඉන්පසුව ඉහත 8.1 උප වගන්තියෙ හි විස්තර කරන ලද ලේඛනය, සී.ආර්.පොතක ඒ ඒ ශ්‍රේණියට වෙන් කරන ලද පිටුවල අනු අංක සහිත ව ලේඛනගත කළ යුතු ය. මේ සඳහා පොතෙහි එක යාව පිටු 02ක් සම්බන්ධ වන සේ යෙදිය හැකි වන අතර, පහත සඳහන් ආකෘතිය ඒ සඳහා භාවිත කළ යුතු ය. මේ ලේඛනගත කිරීම පරිගණකය මඟින් සිදු කරන්නේ නම් මූලික තොරතුරු පමණක් පරිගණක ගත කළ යුතු අතර, අනෙකුත් තොරතුරු එනම් ලබා ගත් ලකුණු හා විශේෂ සටහන් පරිගණක මුද්‍රිත පිටපතෙ හි අතින් සටහන් කළ යුතු ය.

ශ්‍රේණිය - ........................................

| අනු අංකය | ළමයාගේ නම | උපන් දිනය | ස්ත්‍රී/ පුරුෂ භාවය | මව/පියා/ භාරකරුගේ නම | ජාතික හැඳුනුම් පත් අංකය | ලිපිනය | ලබා ගත් ලකුණු | විශේෂ සටහන් |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

8.3 ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටි ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයන්ගේ දරුවන්, ඉහත 7.2 සිට 7.7 දක්වා වූ උප වගන්තිවල සඳහන් ශ්‍රේණි යටතේ ද අදාළ සුදුසුකම් ලබා තිබේ නම්, ක්‍රියාන්විතය සඳහා ලබා දෙන විශේෂ අනුග්‍රහය ගැන නොසලකා කටයුතු කළ යුතු ය.

8.4 සියලු ශ්‍රේණි සඳහා ලකුණු ලබා දීමේ ක්‍රම හඳුන්වා දී ඇති නිසා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් එක් එක් ශ්‍රේණිය සඳහා වෙන වෙන ම ඉදිරිපත් කරන ලේඛනවල අඩංගු අවශ්‍ය විස්තර සටහන් කර ගැනීමටත්, ලකුණු ලබා දීමටත්, ලකුණු ක්‍රමයට අනුකූල වන පරිදි ලකුණු ලබා දීමේ පත්‍රිකා සකස් කර ගැනීමටත් කටයුතු කළ යුතු ය. එම පත්‍රිකාව උපලේඛන අංක 02හි ආකෘතිය අනුව, සම්මුඛ පරීක්ෂණයට පෙර අයදුම්කරු විසින් ද, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ද, අභියාචනා සහ විරෝධතා මණ්ඩලය විසින් ද ඒ ඒ අවස්ථාවේ දී ලබා දෙන ලකුණු සටහන් කර ගැනීමට හැකිවන පරිදි, වෙන වෙන ම තීරු තුනක් සහිත ව සකස් කර ගත යුතු ය.

## 9.0 තෝරා ගැනීමේ ප්‍රථම සම්මුඛ පරීක්ෂණය

### 9.1 සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් තෝරා ගැනීම.

9.1.1 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්පත් පරීක්ෂා කිරීමට පෙර පාසලේ ආගමික ප්‍රතිශතය (ඇත්නම් පමණක්) 4.2 උප වගන්තිය අනුව බෙදා ගැනීමෙන් පසු ව, එක් එක් ශ්‍රේණිය යටතේ ලැබී ඇති අයදුම්පත් ආගම අනුව වෙන් කර ගත යුතු ය. (ශ්‍රේණි අනුව සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේ දී ද, ආගම අනුව වෙන වෙන ම කැඳවා පරීක්ෂා කළ යුතු අතර, ළමයින්ගේ තේරීම් ලැයිස්තුව නිකුත් කිරීමේ දී ද එක් එක් ශ්‍රේණි යටතේ එක් එක් ආගම්වලට හිමි ළමයින් සංඛ්‍යාව අනුව ළමයින්ගේ නාම ලේඛනය වෙන් වෙන් ව දැක්විය යුතු ය.)

9.1.2 අයදුම්පත් ලැබී ලේඛනගත කිරීමෙන් පසු ව, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්පත්වල සඳහන් තොරතුරු පරීක්ෂා කර අයදුම්පත්වල ලකුණු සටහන් කළ යුතු ය. එසේ ලබා දෙන ලකුණු අනුව ප්‍රමුඛතා ලේඛන සකස් කර, එම ලේඛනයේ ඉහළ සිටින, සම්මුඛ පරීක්ෂණය මඟින් ඇතුළත් කළ හැකි සංඛ්‍යාව මෙන් සිව් ගුණයක් වන සේ සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසු අයගේ නාම ලේඛනයක් පිළියෙල කර ගත යුතු ය. මෙම සංඛ්‍යාව වැඩිකර ගැනීමට අවශ්‍ය වන්නේ නම් ජාතික පාසල් සඳහා ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂගේද, පළාත් පාසල් සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේද අනුමැතිය ලබා ගත යුතු ය. පුරප්පාඩු සංඛ්‍යාව මෙන් සිව් ගුණයට අඩුවෙන් අයදුම්පත් ලැබී ඇති අවස්ථාවල දී, අයදුම් කළ සියලු දෙනා ම සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබයි.

9.1.3 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සමඟ සාකච්ඡා කර දින තීරණය කිරීමෙන් පසුව, විදුහල්පති විසින් අදාළ මව්පියන්/නීත්‍යානුකූල භාරකරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවිය යුතු ය. කැඳවීම් ලිපි පාසලේ ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව සහිත ව, සති දෙකකටවත් පෙර අදාළ මව/පියා/ නිත්‍යානුකූල භාරකරුට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය. එසේ යොමු කරනු ලබන ලේඛන සම්බන්ධ තොරතුරු, විධිමත් ව ලේඛනවල සටහන් කර තැබිය යුතු ය. එසේ ම සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දින පිළිබඳ විස්තර, කල් ඇති ව පාසලේ උදෑසන රැස්වීමේ දී ප්‍රකාශ කිරීමෙන් හා දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීමෙන් ප්‍රසිද්ධ කළ යුතු ය. එසේ ම සම්මුඛ පරීක්ෂණයට කැඳවන අයගේ නාමලේඛනය පාසල් දැන්වීම් පුවරුවේ සහ පාසල් වෙබ් අඩවියේ පළ කළ යුතු ය.

9.1.4 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉල්ලුම්පත්‍ර පරීක්ෂා කර ලකුණු ලබා දීමෙන් පසුව, ලකුණු ප්‍රමුඛතා අනුව සකස් කර ගනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව මෙන් සිව් ගුණය ඇතුළත් ලේඛනයේ නොසිටින අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා නොකැඳවිය යුතු ය. එහෙත් ඔවුන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබීමට හේතු පැහැදිලි ව සඳහන් කරන ලද ලිපියක්, අදාළ අයදුම්කරුවන් වෙත සම්මුඛ පරීක්ෂණය ආරම්භ කිරීමට සතියකට පෙර විදුහල්පති විසින් යැවිය යුතු අතර, ඒ පිළිබඳ ලේඛන පවත්වා ගත යුතු ය.

9.1.5 සුදුසුකම් තිබියදීත් තම ළමයාගේ ඉල්ලුම්පත්‍රය සිව් ගුණයට නොගෙන ප්‍රතික්ෂේප වී ඇත්නම් පමණක්, අදාළ ලිපි ලේඛන (පෙර අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කරන ලද ලේඛන පමණක්) සහිත ව නැවත ඉල්ලුම්පත්‍රයක් හා ලකුණු සනාථ කිරීම සඳහා තර්කානුකූල ව ඉදිරිපත් කරන තොරතුරු ඇතුළත් ඉල්ලීමක් ප්‍රතික්ෂේපිත ලිපියේ පිටපතක් සමඟ එම පාසලේ විදුහල්පති වෙත ඉදිරිපත් කළ හැකි ය. ලියුම් කවරයේ වම් කෙළවරේ "පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම - නැවත සලකා බැලීම" ලෙස සඳහන් කර ප්‍රතික්ෂේප ලිපිය ලැබී සතියක් ඇතුළත එවිය යුතු ය.

9.1.6 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණය පවත්වන අතරතුර එසේ ඉදිරිපත් කරන ලද පැමිණිලි, සම්මුඛ පරීක්ෂණය අවසන් වීමට සතියකට පෙර හෝ සලකා බලා සුදුසුකම් ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අතර, නැවතත් ප්‍රතික්ෂේප වන පැමිණිලිකරුවන් වෙත ඒ බව හේතුව පැහැදිලි ව සඳහන් කර ලිපියකින් දැනුම් දිය යුතු ය. මේ සම්බන්ධ අදාළ ලේඛන ද තබා ගත යුතු ය.

## 9.2 සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම

9.2.1 සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී චක්‍රලේඛයේ සඳහන් ලකුණු ක්‍රමයට අනුව, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්පත්‍රයෙ හි ලබා දී ඇති ලකුණු, ලිපි ලේඛන මගින් සනාථ කර ගත යුතු ය. මෙහි දී 8.4 උප වගන්තියෙ හි සඳහන් පරිදි සකස් කර ගත් ලකුණු ලබා දීමේ පත්‍රිකාවෙහි මව්පියන්/නිත්‍යානුකූල භාරකරු අභිමුඛයේ දී ලකුණු ලබා දී එම පත්‍රිකාවෙහි ම එම ලකුණට එකඟවන බවටත්, වැරදි තොරතුරු, කූට ලේඛන ලබා දී ඇති බව තහවුරු වුවහොත් ලකුණු සංශෝධනය වීමට/අහෝසි වීමට ඉඩ ඇති බව තමන් දැන සිටින බවටත් ඔවුන්ගේ අත්සන් ලබා ගත යුතු ය. එම පත්‍රිකාවේ අයදුම්කරු විසින් සටහන් කර තිබෙන ලකුණු, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලබා දෙන ලකුණුවලට වඩා වෙනස් නම්, ඊට හේතු පැහැදිලි කර දිය යුතු ය.

9.2.2 ඉන්පසුව උපලේඛන අංක 02හි සඳහන් පරිදි, ලකුණු ලබා දීමේ පත්‍රිකාවේ ලබා දුන් ලකුණු පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් සම්මුඛ පරීක්ෂණලාභීන්ට ලබා දිය යුතු ය. මෙය සියලු ගණ සඳහා වෙන වෙන ම සකස් කර දිය යුතු ය.

9.2.3 යම් පාසලක් සඳහා ඉල්ලුම්කරුවකු ගණ කිහිපයකින් ඉල්ලුම් කර ඇත්නම්, ඉල්ලුම් කළ සෑම ගණයක් සඳහා ම සුදුසුකම් පරීක්ෂා කළ යුතු ය.

9.2.4 මව්පියන්/නිත්‍යානුකූල භාරකරු විසින් ඉදිරිපත් කරනු ලබන ඡන්ද හිමි නාමලේඛනවල ලියාපදිංචි විස්තර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවලට ලබා දී ඇති ඡන්ද හිමි නාම ලේඛන හෝ මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා සංයුක්ත තැටි (CD) මගින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සනාථ කර ගත යුතු ය.

9.2.5 ඡන්ද හිමි නාම ලේඛනයෙහි ලියාපදිංචිය පිළිබඳ ව යම් ගැටලුවක් මතුවන අවස්ථාවල දී මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් එය සනාථ කර ගත යුතු ය.

9.2.6 සම්මුඛ පරීක්ෂණයේ දී මව්පියන්/නීත්‍යානුකූල භාරකරුවන් විසින් ළමයාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත ද, ඉදිරිපත් කර ඇති විස්තර සනාථ කර ගැනීම සඳහා අදාළ වන සියලු ලිපි ලේඛනවල මුල් පිටපත් ද ඉදිරිපත් කළ යුතු ය. මීට අමතර ව පාසලේ අවශ්‍යතාවය අනුව එම ලේඛනවල ඡායා පිටපත් ගොනුවක් ද ලබා ගත හැකි අතර, එම ගොනුවේ අයදුම්කරුවන්ගේ යොමු අංකය සඳහන් කර සුරක්ෂිතව තබා ගත යුතු ය.

9.2.7 මව්පියන්/නීත්‍යානුකූල භාරකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛනවල නිරවද්‍යතාව, දිවුරුම් පෙත්සමක් ලබා ගැනීමෙන් සහතික කර ගත යුතු ය.

9.2.8 එසේ වුව ද ඉදිරිපත් කරන ලද යම් ලේඛනයක් කූට ලේඛනයක් යැයි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හැඟී යන්නේ නම්, එය නිකුත් කර ඇති ආයතනයෙන් හෝ බලධාරියාගෙන් විමසීමක් කොට, එහි සත්‍ය අසත්‍යතාව තහවුරු කර ගැනීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිට බලය ඇත. එවැනි අවස්ථා ඇති වූ කල් හි, ඒ පිළිබඳ ව අදාළ බලධාරියාට සුදුසු පරිදි කටයුතු කිරීමට දන්වා සිටිය හැකි ය. ඒ අනුව ඉදිරිපත් කර ඇති ලේඛනය හෝ ලේඛන, කූට ලේඛන ලෙස සනාථ වන්නේ නම් එවැනි ලේඛනයක්/ලේඛන ඉදිරිපත් කිරීමට විරුද්ධ ව **නීත්‍යානුකූල ව කටයුතු කිරීමට පියවර ගත හැකි ය.**

## 9.3 තාවකාලික ලැයිස්තුව හා පොරොත්තු ලේඛනය

9.3.1 ප්‍රථම සම්මුඛ පරීක්ෂණයෙන් පසු ව, අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණු අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මඟින් එක් එක් ගණ සඳහා වෙන වෙන ම ලකුණු ප්‍රමුඛතා අනුව ලැයිස්තු පිළියෙල කර ගත යුතු ය. මෙම ලේඛන අනුසාරයෙන් පාසලට ඇතුළත් කිරීම සඳහා, ලකුණු ප්‍රමුඛතා අනුව තාවකාලිකව තෝරා ගන්නා ළමයින්ගේ තාවකාලික ලැයිස්තුවක් පිළියෙල කළ යුතු ය.

මේ සඳහා මෙම චක්‍රලේඛයේ 4.1 උප වගන්තියට අනුව, ඒ ඒ වර්ෂයේදී පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාවෙන් ක්‍රියාන්විත අනුග්‍රහය යටතේ ලබා දෙන පුරප්පාඩු අඩු කිරීමෙන් අනතුරුව අදාළ වර්ෂයේදී සම්මුඛ පරීක්ෂණ මඟින් තෝරාගත යුතු ශිෂ්‍ය ප්‍රමාණය තීරණය කළ යුතුය. 2026 වර්ෂයේ සිට ඉදිරියට සමාන්තර පන්තියකට සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාව 35 කි. තාවකාලික ලැයිස්තුවට අමතර ව, ලකුණු ප්‍රමුඛතා අනුව එක් එක් ගණයකින් වෙන වෙන ම පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 50%ක් වන සේ තාවකාලික පොරොත්තු ලේඛනයක් ද සකස් කළ යුතු ය.

යම් හෙයකින් පාසලේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා උක්ත 50% සීමාව ඉක්මවා පොරොත්තු ලේඛනයේ නම් සඳහන් කිරීම අවශ්‍ය වන්නේ යැයි විදුහල්පතිට හැඟීයන්නේ නම් ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂගේද පළාත් පාසල් සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේද පූර්ව අනුමැතිය මත එය සිදු කළ හැකිය.

9.3.2 තාවකාලික ලැයිස්තුව පහත දක්වා ඇති ආකෘතියට අනුකූල විය යුතු ය. තාවකාලික ලැයිස්තුව සකස් කිරීමේදී පාසලේ පුරප්පාඩු සංඛ්‍යාව අනුව ලකුණු අනු පිළිවෙළට එක් එක් ගණය වෙන වෙනම සඳහන් කළ යුතුය. මේ අයුරින්ම පොරොත්තු ලේඛනයද සකස් විය යුතුය. **මෙහි දී අවසාන ලකුණේ සම ලකුණු ලබා ගත් ළමයින් කිහිප දෙනෙකු සිටින්නේ නම් පාසලට ඇති ආසන්නතාව අනුව පෙළ ගැස්විය යුතු ය. එක් එක් ගණයන්ට වෙන වෙන ම ලකුණු ලබා දුන්න ද ආසන්නතාව අනුව පාසල් ලබා දීම වඩා සාධාරණ බැවින්, මෙවැනි අවස්ථාවක පමණක් පාසලට ඇති ආසන්නතාව අනුව (දුර අනුව) පෙළ ගැස්වීම සිදු කළ යුතු ය. (මෙය අවසාන ලේඛනය සකස් කිරීමේ දී ද අදාළ කර ගත යුතු ය.)**

ගණය : .......................
පුරප්පාඩු සංඛ්‍යාව : .......................

| අනුක්‍රමික අංකය | ළමයාගේ නම | මවගේ/පියාගේ නිත්‍යානුකූල භාරකරුගේ නම | හැඳුනුම්පත් අංකය | ලිපිනය | ලබා ගත් ලකුණු | විශේෂ සටහන් |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය :**

නම                                        අත්සන

1.
2.
3.
4.
5.

9.3.3 තාවකාලික ලැයිස්තුව හා පොරොත්තු ලේඛන ප්‍රසිද්ධ කිරීමට පෙර පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ, ඉහත ලේඛනවල නම් සඳහන් ළමයින්ගේ පදිංචිය, ස්ථානීය පරීක්ෂණ මඟින් තහවුරු කර ගත යුතු ය. උපරිම අවස්ථා තුනකදීවත් ස්ථානීය පරීක්ෂණයේ දී පදිංචිය තහවුරු නොවේ නම්, තාවකාලික ලැයිස්තුව හා පොරොත්තු ලේඛනවලින් එම නම් ඉවත්කළ යුතු ය. මෙහි දී අභියාචනා ඉදිරිපත් කිරීමට ඉල්ලා සිටින අයදුම්කරුවන් අභියාචනා පරීක්ෂණය සඳහා කැඳවිය යුතු ය. අවශ්‍ය වන්නේ නම් අනෙකුත් ගණ සඳහා ද ස්ථානීය පරීක්ෂණ කළ හැකි ය. (යම් පුද්ගලයකු පදිංචි බව හෝ පදිංචි නොවන බව පසුකාලීන ව සනාථ කිරීමට අවශ්‍ය වුවහොත් එය සනාථ කිරීමට හැකි වන පරිදි ස්ථානීය පරීක්ෂණ පිළිබඳ සියලු තොරතුරු සමඟ වාර්තා සකස් කොට තබා ගත යුතු ය. මෙම වාර්තාවේ ස්ථානීය පරීක්ෂණය කළ දිනය, වේලාව සහ ස්ථානීය පරීක්ෂණය කළ අයගේ නම හා අත්සන, ස්ථානීය පරීක්ෂණය සිදුකරන අවස්ථාවේදී සිටි නිවැසියන්ගේ තොරතුරු (ජා.හැඳුනුම්පත් අංක, අත්සන............ යනාදී) අනිවාර්යයෙන් ඇතුළත් කළ යුතු ය.

9.3.4 ගණ කිහිපයකින් ඉල්ලුම් කළ ළමයකු ඉන් එක් ගණයකට වඩා තේරී ඇති අවස්ථාවක දී, එම එක් ගණයකින් හෝ තේරී පත් වීමට අවස්ථාවක් ඇත්නම් පමණක්, එම ගණය යටතේ ළමයාගේ නම ඉතිරි කර අනෙකුත් ගණවල ලැයිස්තුවලින් ඉවත් කළ යුතු ය.

9.3.5 ඉහත සඳහන් පරිදි සකස් කරන ලද තාවකාලික ලේඛනයේ, පොරොත්තු ලේඛනයේ පිටපත් 04ක් ලබා ගෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියලු ම සාමාජිකයන් සියලු ම පිටුවල අත්සන් කිරීමෙන් අනතුරුව විදුහල්පති භාර ගත යුතු ය. කෙසේ වෙතත් නියමිත කාලයට මෙම ලේඛනය ප්‍රදර්ශනය කිරීම අනිවාර්ය වන හෙයින්, කිසියම් හේතුවක් මත සියලු දෙනාගේ අත්සන් ඒ වන විට ලබා ගැනීමට නොහැකි වන්නේ නම්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති, ලේකම් හා පාසලේ ප්‍රාථමික අංශ ප්‍රධානියා/ජ්‍යෙෂ්ඨ ගුරුවරයා ඇතුලු ව මණ්ඩලයේ අනෙක් සාමාජිකයන් අතුරින් අවම වශයෙන් එක් අයකුගේ අත්සන සහිතව හෝ විදුහල්පති විසින් එම ලේඛන භාරගත යුතු ය. ඉන් අනතුරු ව විදුහල්පති විසින් ජාතික පාසලක් නම්, ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂට එක් පිටපතක් ද, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට එක් පිටපතක් ද, පළාත් පාසලක් නම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට එක් පිටපතක් බැගින් ද ලබා දිය යුතු ය. තෙවන පිටපත පාසල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු අතර, හතර වන පිටපත පාසල් ගොනුවේ ගොනු කිරීම ද කළ යුතු ය. මීට අමතර ව පළාත් පාසලක් නම් තවත් පිටපතක් ලබා ගෙන, පළාත් අධ්‍යාපන ලේකම් වෙත ද එවිය යුතු ය.

තාවකාලික ලේඛනය හා තාවකාලික පොරොත්තු ලේඛනය පාසලේ ප්‍රදර්ශනය කිරීමට ප්‍රථම වෙනත් පාර්ශවයන් වෙත ලබා නොදීමට විදුහල්පතිවරයා විසින් වගබලා ගත යුතු ය.

9.3.6 තාවකාලික ලේඛනය, පොරොත්තු ලේඛනය දැන්වීම් පුවරුවේ සහ පාසලේ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කළ යුතු ය. එම අවස්ථාවේ දී ම ''මෙම ආකෘතියට අනුව අභියාචනා/විරෝධතා ඉදිරිපත් කළ යුතුය'' යැයි සටහනක් යොදා, චක්‍රලේඛයේ උපලේඛන අංක 03 හි දැක්වෙන ආකෘතිය ද ප්‍රදර්ශනය කළ යුතු ය.

9.3.7 දැන්වීම් පුවරුවේ සහ පාසලේ වෙබ් අඩවියේ පළ කරනු ලබන තාවකාලික ලැයිස්තුව හා පොරොත්තු ලේඛනය සති දෙකක්වත් අඛණ්ඩ ව ප්‍රදර්ශනය කළ යුතු ය. තාවකාලික ලැයිස්තුව අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අත්සන් (9.3.5හි දෙන ලද උපදෙස්වලට අනුකූල ව) නොමැති ව ප්‍රසිද්ධ කිරීම නොකළ යුතු ය.

## 10.0 අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කිරීම.

10.1 තාවකාලික ලේඛනය, පොරොත්තු ලේඛනය පාසල් දැන්වීම් පුවරුවේ සහ පාසලේ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර සති 02ක් ඉකුත් වීමට පෙර, **පාසලට අයදුම් කළ අයදුම්කරුවන් විසින් පමණක්,** එම ලේඛනවල යම් ස්ථානයක නුසුදුසු ළමයෙකුගේ නම අඩංගු වී ඇත්නම් ඒ පිළිබඳ විරෝධතාව හා/හෝ සුදුසුකම් තිබියදීත් තම දරුවාගේ නම නුසුදුසු තැනක ඇත්නම් ඒ පිළිබඳ ව අභියාචනයක් විදුහල්පති වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු ය. මෙම අභියාචනය, තාවකාලික ලේඛනය සමඟ දැන්වීම් පුවරුවේ සහ පාසලේ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කරන ලද ආකෘති පත්‍රයට අනුව සකස් කළ යුතු ය. අභියාචනා හා/ හෝ විරෝධතා සමඟ, තම නම සහ ලිපිනය සඳහන් ලියාපදිංචි තැපැල සඳහා අවශ්‍ය මුද්දර සහිත ලියුම් කවරයක් ද එවිය යුතු ය. මෙම කාල සීමාවෙන් පසු ව ඉදිරිපත් කරනු ලබන කිසිදු අභියාචනයක් හෝ විරෝධතාවයක් සලකා බලනු නොලැබේ.

10.2 අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ලේඛන

10.2.1 විදුහල්පතිගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ, සියලු ම විරෝධතා ලිපි වෙන වෙන ම අංක කර, පහත සඳහන් ආකෘතියට අනුව ලේඛනගත කිරීමේ වගකීම, ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයකු නොවූ විදුහලේ නියෝජ්‍ය විදුහල්පතිවරයෙකුට පැවරිය යුතු ය.

| අනු අංකය | විරෝධතාවට ලක්වූ ළමයාගේ නම | එම ළමයාගේ කැඳවීම් අංකය | එම ළමයාගේ මව/පියා/ භාරකරුගේ නම හා ලිපිනය | ලිපි අංකය | දැක් වූ විරෝධතාව කෙටියෙන් |
|---|---|---|---|---|---|
| | | | | | |

(මෙම ලේඛනය රහසිගත ව තබා ගත යුතු වේ.)

10.2.2 මීට අමතර ව, අභියාචනා ඉදිරිපත් කළ අයගේ ලේඛනයක් ද ඉහත 10.2.1හි සඳහන් කරන ලද නියෝජ්‍ය විදුහල්පති විසින් සුදුසු අයුරින් සකස් කර ගත යුතු ය.

10.3 අභියාචනා හා විරෝධතා පිළිබඳ දැනුම් දිය යුතු පාර්ශවයන්

10.3.1 සියලු ම විරෝධතා හා අභියාචනා ලේඛනගත කර, අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කිරීමට ලබා දී ඇති දෙසතියක කාල සීමාව ඉකුත් වීමෙන් පසු, දින දහයක් ඇතුළත විරෝධතාවලට ලක් වූ ළමයින්ගේ සංඛ්‍යාව හා අභියාචනා ඉදිරිපත් කර ඇති සංඛ්‍යාව, පළාත් පාසලක් නම් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද, ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද විදුහල්පති විසින් ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දිය යුතු ය.

10.3.2 ලේඛනගත ඉහත සඳහන් විරෝධතා ලේඛනය හා අභියාචනා ලේඛනය අනුව, මූලික සම්මුඛ පරීක්ෂණයට උපයෝගී කර ගත් ලේඛනයේ (සී.ආර්.පොත /පරිගණක මුද්‍රිත ලේඛන) අදාළ නම් යටින් එක් වර්ණයකින් ඉරි ඇඳීම හෝ ඉස්මතු කිරීමෙන් (Highlight) විරෝධතාවට ලක් වන බව දැක්විය යුතු අතර, අභියාචනා ඉදිරිපත් කළ අයගේ නම් වෙනත් වර්ණයකින් ඉරි ඇඳීම හෝ ඉස්මතු කර දැක්වීම කළ යුතු ය.

## 11.0 අභියාචනා හා විරෝධතා පරීක්ෂණ

11.1 පාසල වෙත ලැබූ අභියාචනා හා විරෝධතා විධිමත් ව පරීක්ෂා කොට තීරණයක් ගැනීම සඳහා අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ගත යුතු ය. මෙම මණ්ඩලය

ජාතික පාසල් සඳහා ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත් කළ යුතු අතර, පළාත් පාසල් සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත් කළ යුතු ය.

**11.2 අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සංයුතිය පහත සඳහන් පරිදි විය යුතු ය.**

11.2.1 පාසල් වර්ගීකරණයට අනුව සමාන මට්ටමේ වෙනත් පාසලක විදුහල්පතිවරයෙක් (පාසල් දෙකක විදුහල්පතිවරුන් එම පාසල් දෙකට මාරු කර පත් කිරීම නොකළ යුතු ය.)/අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියකු (සභාපති)

11.2.2 අදාළ පාසලේ වසරකට වැඩි සේවා කාලයක් සහිත පළමු සම්මුඛ පරීක්ෂණ පරීක්ෂණ මණ්ඩලයට සහභාගි නොවූ නියෝජ්‍ය/සහකාර විදුහල්පති/ අංශ ප්‍රධානි/ ජ්‍යෙෂ්ඨ ගුරුවරයෙක් (ලේකම්)

11.2.3 පාසල් සංවර්ධන සමිති නියෝජිතයෙක් (එම පාසලේ ආදි ශිෂ්‍යයෙක් හෝ පාසලේ අධ්‍යයන හෝ අනධ්‍යන කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු නොවිය යුතු ය.)

11.2.4 ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද, පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද නම් කරනු ලබන වෙනත් විදුහලක සේවය කරන නියෝජ්‍ය විදුහල්පති, සහකාර විදුහල්පති හෝ අංශ ප්‍රධාන තනතුරක සේවය කරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරියකු (සභාපති සේවය කරන පාසලේ කෙනෙකු නොවිය යුතු ය.).

11.2.5 ආදි ශිෂ්‍ය සංගමයේ නියෝජිතයකු

**11.3 අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය පත් කිරීමේ දී සැලකිය යුතු කරුණු**

11.3.1 ඉහත සඳහන් අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සියලු ම සාමාජිකයන්, අදාළ පාසලේ ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ හෝ අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ පසුගිය වර්ෂ දෙකක කාලය තුළ නොසිටි අය විය යුතු ය. ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේකම් ලෙස කටයුතු කළ පුද්ගලයා, අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ අවශ්‍යතාව අනුව සහයෝගය ලබා දිය යුතු ය. එහිදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ගත් පොදු තීරණ ඇතුළත් සියලු වාර්තා අධ්‍යයනය සඳහා අභියාචනා මණ්ඩලයට ලබාදිය යුතු ය.

11.3.2 මෙම අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ ඕනෑම සාමාජිකයකුගේ දරුවෙකු හෝ මුණුබුරකු/මිණිබිරියක හෝ තමාගේ/කලත්‍රයාගේ සහෝදර සහෝදරියන්ගේ දරුවන් මෙම පාසලට ඇතුළත් වීමට අයදුම් කර ඇති විට ඔහුට/ඇයට එම පාසලේ මෙම පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකත්වය දැරිය නොහැකි ය.

11.4 මීට අමතර ව 11.1 උප වගන්තියෙ හි සඳහන් පත් කිරීමේ බලධරයා විසින් මෙම අභියාචනා හා විරෝධතා පරීක්ෂණ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධරයකු පත් කළ හැකි ය.

11.5 නිරීක්ෂණය කරනු ලබන නිලධරයා අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයට සම්බන්ධ නොවන අතර, මෙම කටයුතු නිරීක්ෂණය කර අවශ්‍ය උපදෙස් ලබා දෙනු ඇත. තව ද අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයට අවශ්‍ය වන්නේ නම් මෙම නිරීක්ෂකයාගෙන් උපදෙස් ලබා ගැනීමට ද හැකි ය.

11.6 විරෝධතා විභාග කිරීමේ දී, විරෝධතාවලට ලක් වූ ළමයාගේ මව්පියන්/නිත්‍යානුකූල භාරකරුවන් විසින් ප්‍රථම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ ලිපි ලේඛන පමණක්, නැවත වරක් විමර්ශනය කරන අතර, විරෝධතාව දැක්වූ අය කැඳවා විරෝධතාවෙ හි නිරවද්‍යතාව විමර්ශනයට ලක් කළ යුතු ය. ඉන්පසු විරෝධතාවට ලක් වූ ළමයාගේ මව්පියන්/නිත්‍යානුකූල භාරකරුවන් ද කැඳවා පරීක්ෂා කර තීරණයකට එළඹීම අවශ්‍ය වේ. මෙහි දී ඔවුන්ට කරුණු පැහැදිලි කර ගැනීමට අවස්ථාවක් ලබා දිය යුතු ය. විරෝධතාව දැක් වූ මව්පියන්/නිත්‍යානුකූල භාරකරුවන් හා විරෝධතාවයට ලක් වූ ළමයින්ගේ මව්පියන්/නිත්‍යානුකූල භාරකරුවන් වෙන වෙන ම කැඳවිය යුතු ය. ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ දී භාවිත කළ සී.ආර්.පොතෙහි/ පරිගණක මුද්‍රිත ලේඛනයෙ හි විශේෂ සටහන් තීරුවේ, මේ පිළිබඳ විස්තර හා තීරණ රතු පාටින් ලියා දැක්විය යුතු අතර, විරෝධතා පරීක්ෂණය සම්බන්ධ ව වෙන ම වාර්තාවක් ද තබා ගත යුතු ය.

11.7 යම් හෙයකින් විරෝධතාවට ලක් වූ ළමයාගේ මව්පියන්/නිත්‍යානුකූල භාරකරුවන් විධිමත් ව දැනුම් දී තිබිය දී ත් විරෝධතා විභාගය සඳහා නොපැමිණියේ නම්, විරෝධතාව පිළිබඳව ඒක පාර්ශ්විකව තීරණ ගැනීමට අභියාචනා මණ්ඩලයට හැකි ය.

11.8 අභියාචනා විභාග කිරීමේ දී ද, අභියාචනා ඉදිරිපත් කළ සියලුදෙනා ම කැඳවා, සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ ලිපි ලේඛන පමණක් නැවත වරක් විමර්ශනය කළ යුතු ය. මෙහි දී ගනු ලබන තීරණ හා අදාළ විස්තර, ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ දී උපයෝගී කර ගත් සී.ආර්.පොතෙහි/පරිගණක මුද්‍රිත ලේඛනයෙහි, රතු පාටින් විශේෂ සටහන් තීරුවේ ලියා දැක්විය යුතු අතර, වෙන ම වාර්තාවක් ද තබා ගත යුතු ය.

11.9 අභියාචනා හා විරෝධතා පරීක්ෂා කිරීම සඳහා කැඳවීම් සිදු කරන අවස්ථාවේ ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ දී ලබා දුන් ලකුණු පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව, අයදුම්කරුවන් විසින් රැගෙන ආ යුතු බව දැන්විය යුතු ය.

11.10 මුල් සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්ට ලකුණු ලබා දීම සඳහා පාසල විසින් භාවිත කළ ලකුණු පත්‍රිකාවේ ම අභියාචනා හා විරෝධතා මණ්ඩලයේ ලකුණු ද, අදාළ තීරුවේ සටහන් කළ යුතු ය. එමෙන් ම අයදුම්කරුවන් වෙත ලබා දී ඇති සංක්ෂිප්ත වාර්තාවේ ද අදාළ තීරුවේ ලකුණු සටහන් කර, නැවත අයදුම්කරු වෙත ලබා දිය යුතු ය.

11.11 අභියාචනා හා විරෝධතා විභාග කිරීමේ කටයුතු විවෘතව හා විනිවිදභාවයෙන් යුක්ත ව පැවැත්විය යුතු අතර, අවශ්‍ය වෙතොත් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ ලිපි ලේඛනවල කරුණු සම්බන්ධයෙන් ගැටලු මතුවේ නම් ඒ පිළිබඳව විධිමත් සටහන් සහිතව පැහැදිලි කර ගැනීම් සිදු කළ හැකිය.

මෙහිදී තාවකාලික ලැයිස්තුව හා තාවකාලික පොරොත්තු ලේඛනයට ඇතුළත්ව ඇති අයදුම්කරුවන්ගේ පදිංචිය සම්බන්ධයෙන් මතු වූ විරෝධතාවයකදී හැර අභියාචනා හා විරෝධතා මණ්ඩලය විසින් ස්ථානීය පරීක්ෂණ පැවැත්වීම සිදු නොකළ යුතු ය.

අභියාචනා හා විරෝධතා විභාග කිරීමේ දී ස්ථානීය පරීක්ෂණ සිදුකිරීම සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී සහභාගි නොවූ සාමාජිකයින් විසින් සිදු කළ යුතු ය.

11.12 අභියාචනා හා විරෝධතා පරීක්ෂණයට කැඳවීම හා සංවිධාන කටයුතු සිදු කිරීම විදුහල්පතිගේ වගකීම වේ.

## 12.0 අවසාන ලැයිස්තුව

### 12.1 අවසාන ලැයිස්තුව සකස් කිරීමේ දී සැලකිය යුතු කරුණු

12.1.1 අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් අභියාචනා හා විරෝධතා පරීක්ෂා කිරීමෙන් පසු, අවසාන ලැයිස්තුව සැකසිය යුතු ය. මෙහි දී ලකුණුවල වෙනස්කමක් සිදු වන්නේ නම්, තාවකාලික ලැයිස්තුවේ නිසි තැනට අභියාචනාකරුවන් හා විරෝධතාවට ලක් වූ/දැක් වූ අය ඇතුළත් කොට, නැවත සංශෝධිත තාවකාලික ලේඛනය සකස් කළ යුතු ය.

12.1.2 ඉහත 12.1.1 අනුව සකස් කිරීමේ දී අභියාචනා හා විරෝධතාවලින් සුදුසුකම් ලබා තාවකාලික ලැයිස්තුවේ නිසි තැන්වලට ළමයින් ඇතුළත් වන අවස්ථාවේ දී, තාවකාලික ලැයිස්තුවේ අවසානයට සිටින ළමයින් ලැයිස්තුවෙන් ඉවත් වීමට ඉඩ ඇත. එවැනි ළමයින්ගේ මව්පියන් නැවත අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් කැඳවා, ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් පසු ව අවසාන තීරණයකට එළඹිය යුතු ය.

12.2 සංශෝධිත තාවකාලික ලේඛනයේ සිටින ළමයින්ගෙන් ලකුණු ප්‍රමුඛතා අනුව අවශ්‍ය සංඛ්‍යාව තෝරා ගෙන අවසාන ලැයිස්තුව සැකසිය යුතු ය. **අවසාන ලැයිස්තුව මඟින් සමාන්තර පන්තියක් සඳහා ළමයින් සංඛ්‍යාව 4.1 උපවගන්තියට අනුව තෝරා ගත යුතු ය.**

### 12.3 අවසාන ලේඛනය ප්‍රදර්ශනය කිරීමේ දී සැලකිය යුතු කරුණු

12.3.1 දැන්වීම් පුවරුවේ සහ පාසලේ වෙබ් අඩවියේ අවසන් ලේඛනය ප්‍රදර්ශනය කිරීමට පෙර, එක ම ළමයාගේ නම පාසල් කිහිපයක තිබීම වැළැක්වීම සඳහා අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් කැඳවිය යුතු ය. එම රැස්වීම සඳහා, එසේ සිදු වී ඇතැයි සිතන පාසල්වල විදුහල්පතිවරුන් කැඳවිය යුතු ය.

12.3.2 එම රැස්වීමේ දී අදාළ පාසල්වල අවසන් ලේඛනය මඟින් එක ම ළමයාගේ ම නම පාසල් කිහිපයක ම තිබෙනවා ද යන්න සොයා බලා, එම ළමයින්ගේ ලේඛනයක් සකසා ගත යුතු ය. පසුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා අදාළ විදුහල්පතිවරුන් විසින් අයදුම්පතෙහි මව්පියන්/නිත්‍යානුකූල භාරකරුවන් විසින් ඉල්ලා ඇති පාසල් ප්‍රමුඛතා අනුව, පහළ ප්‍රමුඛතා දක්වා ඇති පාසල්වල ලැයිස්තුවෙන් නම ඉවත් කර, ඉහළ ප්‍රමුඛතා ලබා දී ඇති පාසලේ අවසාන ලේඛනයේ පමණක් නම ඉතිරි කළ යුතු ය.

12.3.3 තාවකාලික ලේඛනයේ ඇතුළත් ව සිටි ළමයින්ගේ නම් අවසන් ලේඛනය සකස් කිරීමේ දී ඉවත් වී අදාළ සංඛ්‍යාව අඩු වන්නේ නම්, අදාළ ගණයේ පොරොත්තු ලේඛනයේ ඉහළ සිටින ළමයින්ගේ නම් අවසන් ලේඛනයේ අවසානයට ඇතුළත් කළ යුතු ය.

12.3.4 අවසාන ලේඛනය හා අවසන් පොරොත්තු ලේඛනය සකස් කිරීමෙන් පසු, අනෙකුත් ළමයින්ගේ නාම ලේඛනය ද ලකුණු ප්‍රමුඛතා අනුව සකස් කර තබා ගත යුතු වේ. එම ලේඛනය ද අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් අත්සන් කළ යුතු ය.

### 12.4 අවසාන ලැයිස්තුව හා අවසාන පොරොත්තු ලේඛනය ඉදිරිපත් කිරීම

12.4.1 එක් එක් ගණවල වෙන වෙන ම අවසාන ලැයිස්තුව, අවසාන පොරොත්තු ලේඛනය පිටපත් 04 කින් සකස්කර, අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් පරීක්ෂණයට ලක් කළ ළමුන් සඳහා පමණක් වගකියනු ලබන බවට සටහනක් තබා, එම මණ්ඩලයේ සියලු ම සාමාජිකයන් විසින් අදාළ ලේඛනවල සියලු ම පිටුවල

අත්සන් තැබිය යුතු ය. මෙම ලේඛන නියමිත කාලයේ දී ප්‍රදර්ශනය කිරිම අනිවාර්ය වේ. එබැවින් යම් හේතුවක් මත සියලු දෙනාගේ අත්සන් ලබා ගැනීමට නොහැකි වන අවස්ථාවන් හි දී, අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සභාපති, ලේකම් හා ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන නිලධාරියා ඇතුළු ව, අනිකුත් සාමාජිකයන් අතුරින් අවම වශයෙන් එක් අයකුගේ අත්සන සහිතව හෝ අදාළ පාසලේ විදුහල්පති විසින් මෙසේ සම්පූර්ණ කරනු ලබන ලේඛන භාර ගෙන, ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂට හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට එක් පිටපතක් බැගින් ද, පළාත් පාසලක් නම් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට එක් පිටපතක් බැගින් ද ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු අතර, එහි තෙවන පිටපත පාසල් දැන්වීම් පුවරුවේ හා පාසල් වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කළ යුතු ය. සිව්වන පිටපත පාසලේ ගොනු කර තබා ගත යුතු ය. මීට අමතර ව පළාත් පාසලක් නම් තවත් පිටපතක් ලබා ගෙන පළාත් අධ්‍යාපන ලේකම් වෙත ද යැවිය යුතු ය.
අවසාන ලැයිස්තුව, අවසාන පොරොත්තු ලේඛනය පාසලේ ප්‍රදර්ශනය කිරීමට ප්‍රථම වෙනත් පාර්ශවයන් වෙත ලබා නොදීමට විදුහල්පතිවරයා විසින් වගබලා ගත යුතු ය.

12.4.2 දැන්වීම් පුවරුවේ සහ පාසලේ වෙබ් අඩවියේ ඇතුළත් කරන ලේඛන දෙක, (අවසාන ලැයිස්තුව, අවසාන පොරොත්තු ලේඛනය සති දෙකක්වත් අඛණ්ඩ ව ප්‍රදර්ශනය කළ යුතු ය. මෙම ලේඛන අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ අත්සන් (12.4.1හි උපදෙස්වලට අනුකූල ව) නොමැති ව ප්‍රසිද්ධ කිරීම නොකළ යුතු ය.

12.5 තෝරා ගත් ළමයින්ගේ දෙමාපියන්/නීත්‍යානුකූල භාරකරුවන්ට, ලිඛිත ව විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව සහිත ව ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දිය යුතු ය. පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත්කිරීම සඳහා දෙමාපියන්/නීත්‍යානුකූල භාරකරුවන් සමඟ ළමයා පැමිණීම අනිවාර්ය වන අතර, තෝරාගත් ළමයින් ඇතුළත් කිරීමට නියමිත දින සිට සති 2ක් තුළ පාසලට ඇතුළත් කිරීම අනිවාර්ය වේ. කිසිඳු හේතුවක් මත ළමයකු ඇතුළත් කර ගැනීම සඳහා කාලය දීර්ඝ නොකෙරේ. එම කාලය තුළ ළමයා පාසලට ඇතුළත් නොකරන්නේ නම්, එම ළමයා පාසලට ඇතුළත් නොකරන ළමයකු සේ සලකා අදාළ පුරප්පාඩුව පොරොත්තු ලේඛනයෙන් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු අතර, ඒ බව දෙමාපියන්ට ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දිය යුතු ය.(උපලේඛන අංක 04 ආකෘතිය අනුව)

ළමයින් ඇතුළත් කිරීමේ සියලු කටයුතු 2026 වර්ෂයේ මැයි 31 දින වන විට අවසන් කර ඒ පිළිබඳ තොරතුරු ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂට හා පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතද යොමු කළ යුතු ය.

12.6 අවසන් ලේඛනය ප්‍රසිද්ධ කරන අවස්ථාවේදීම තෝරා නොගත් අයදුම්කරුවන්ට විදුහල්පතිගේ අත්සන හා නිලමුද්‍රාව සහිත ව, ඒ බව ලිඛිත ව දන්වා යැවිය යුතු ය. ළමයින් තෝරා ගැනීමේ දී ඒ ඒ ගණයට සීමා වූ අවම ලකුණු ප්‍රමාණය, අනිවාර්යයෙන් ම එම ලිපියේ සඳහන් කළ යුතු ය. මේ සඳහා මෙම චක්‍රලේඛයේ උපලේඛන අංක 05 දරන ආකෘතිය භාවිත කළ යුතු ය.

12.7 තෝරා ගත් ළමයින්ගේ ලියකියවිලිවල ඡායා පිටපත් අඩංගු ලිපි ගොනු වෙන ම තබා ගත යුතු අතර, නොතේරුණු ළමයින්ගේ ලිපිගොනු ද වෙන ම තබා ගත යුතු ය.

12.8 අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කරන ලද යම් අයදුම්කරුවකු පිළිබඳ ව අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් දෙනු ලබන තීරණය අවසාන තීරණය වනු ඇත.

12.9 පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම සම්බන්ධ ව අධීක්ෂණය කිරීමටත්, යම් ගැටලුවක් ඇති වුවහොත් එය නිරාකරණය කිරීමට අදාළ තීරණ ගැනීමටත්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට බලය ඇත.

## 13.0 ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටි ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයන්ට ලබා දෙන විශේෂ අනුග්‍රහ

13.1 ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටි ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයන් විසින් තම ළමයින් පාසල්වලට ඇතුළත් කිරීම සඳහා අයදුම්පත් ත්‍රිවිධ හමුදාව හා පොලීසිය අයත් වන අමාත්‍යාංශයේ ලේකම් වෙත හෝ අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතු ය.

13.2 ත්‍රිවිධ හමුදාව හා පොලීසිය අයත් වන අමාත්‍යාංශයේ ලේකම්වරු මඟින් ළමයින් තෝරා ගැනීම සඳහා අදාළ නිර්ණායක හා ලකුණු ක්‍රමයක් සකස් කර ගත යුතු ය. ක්‍රියාන්විත සේවයේ යෙදී සිටිය දී ආබාධිත වූ අයගේ දරුවන් වෙනුවෙන් මෙහි දී ප්‍රමුඛතාවය ලබා දී සුවිශේෂී අනුග්‍රහයක් හිමි වන සේ, එම ලකුණු ක්‍රමය හා නිර්ණායක සකස් කරගත යුතු ය. එසේ සකස් කරනු ලබන ලකුණු ක්‍රමයට අනුව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා ගන්නා පාසල් නාම ලේඛනයේ සඳහන් පාසල්වලට යොමු කළ හැකි ළමයින් සංඛ්‍යාව තෝරා ගැනේ. ක්‍රියාන්විත අනුග්‍රහය සඳහා එක් සමාන්තර පන්තියකට තෝරා ගනු ලබන්නේ ළමයින් 05 දෙනෙකු පමණි.

13.3 එක් එක් පාසලට ක්‍රියාන්විත අනුග්‍රහය මඟින් තෝරාගත් ළමයින්ගේ ලැයිස්තු, ත්‍රිවිධ හමුදාව හා පොලීසිය අයත් වන අමාත්‍යාංශයේ ලේකම්වරු මඟින්, ඔක්තෝබර් මස 30 වන දිනට පෙර අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

13.4 ත්‍රිවිධ හමුදාව හා පොලීසිය අයත් වන අමාත්‍යාංශවලින් පාසල්වලට තෝරා එවනු ලබන ළමයින් පාසලට ඇතුළත් කර ගැනීමට ප්‍රථම, අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවටත්, ඉදිරිපත් කරන ලේඛන සත්‍ය බවටත් විදුහල්පතිවරුන් විසින් සනාථ කර ගත යුතු ය.

13.5 ත්‍රිවිධ හමුදාව හා පොලීසිය අයත් වන අමාත්‍යාංශය සමඟ මෙම කටයුතු සම්බන්ධීකරණය ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඉටු කරනු ඇත.

## 14.0 තවදුරටත් පවතින පුරප්පාඩු සඳහා ළමයින් ඇතුළත් කිරීම.

14.1 තෝරා ගත් අවසන් ලේඛනයේ නම් සඳහන් ළමයින් ද, ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටි සාමාජිකයන්ගෙන් තෝරා යොමු කරන ලද ළමයින් ද, ඇතුළත් කිරීමෙන් පසු ව තවදුරටත් පුරප්පාඩු පවතින්නේ නම්, අදාළ ගණය අනුව අවසාන පොරොත්තු ලේඛනයේ සඳහන් අනුපිළිවෙලින් පුරප්පාඩු පිරවිය යුතු ය. ක්‍රියාන්විත රාජකාරි සඳහා ලබා දෙන විශේෂ අනුග්‍රහය යටතේ ළමයින් ඇතුළත් කිරීමෙන් අනතුරු ව, තවදුරටත් එම අනුග්‍රහය යටතේ පුරප්පාඩු පවතී නම්, මෙම චක්‍රලේඛයේ 7.1 හි සඳහන් ගණ 06 තුළ සමානුපාතිකව බෙදා හැර එම ගණයන් හි පොරොත්තු ලේඛනයේ අනුපිළිවෙළට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය. මෙම ක්‍රමවේදයට පරිබාහිර ව ක්‍රියාන්විත විශේෂ අනුග්‍රහය යටතේ ඉතිරි වන පුරප්පාඩු සම්පූර්ණ නොකළ යුතු ය.

14.2 ඉහත 14.1හි සඳහන් පරිදි ඒ ඒ ගණවල අවසාන පොරොත්තු ලේඛනවල සිටින ළමයින් සියළු දෙනා ද ඇතුළත් කළ පසු, තවදුරටත් පවතින පුරප්පාඩු පිරවීම සඳහා ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ද පළාත් පාසලක් නම් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ද අනුමතිය ලබා ගත යුතු ය.

## 15.0 තෝරා නොගත් ළමයින්ට පාසල් ලබා දීම.

15.1 අයදුම්කරු විසින් ඉල්ලුම් කරන ලද පාසල් අතුරින්, තේරී ඇති පාසලකට දරුවා ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය. කිසි ම පාසලකට තෝරා නොගත් යම් ළමයෙකුගේ මව්පිය/නිත්‍යානුකූල භාරකරු විසින් තමන්ගේ ළමයාට විකල්ප පාසලක් ලබා ගැනීම සඳහා, අනිවාර්යයෙන්ම මසක් ඇතුළත තමන් පදිංචි ප්‍රදේශයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නව අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය. ඒ අනුව කිසි ම පාසලක් නොලැබූ ළමයින්ට පාසල් ලබා දීම, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වේ.

15.2 තෝරා නොගත් ළමයින් පිළිබඳ වාර්තාවක්, විදුහල්පති විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය. එම වාර්තාව, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කිසිදු පාසලක් නොලැබූ ළමයින්ට පාසලක් ලබා දීමේ දී උපයෝගී කර ගත යුතු ය.

## 16.0 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලවල සහ අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලවල සාමාජිකයන් සඳහා ද, එම කටයුතු වෙනුවෙන් ද යම් වියදමක් දැරීමට සිදු වන්නේ නම් ඒ සඳහා අදාළ අධ්‍යාපන බලධාරීන්ගේ අවසරය මත, පාසල් සංවර්ධන සමිති ගිණුමෙන් වියදම් කළ හැකි ය. මෙම වියදම පාසලේ වාර්ෂික සැලැස්මට ඇතුළත් කළ යුතු ය.

## 17.0 කාල රාමුව

පළමුවන ශ්‍රේණියට ළමයින් තෝරා ගැනීමේ වැඩ කටයුතු පහත සඳහන් කාල රාමුවට අනුව අනිවාර්යයෙන් ම නිම කළ යුතු ය.

| | | | |
|---|---|---|---|
| (i) | සුදුසුකම් සලකා බලනු ලබන අවසන් දිනය | - | ජුනි 30 |
| (ii) | ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය | - | අගෝස්තු 04 |
| (iii) | සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම | - | සැප්තැම්බර් 30ට පෙර |
| (iv) | තාවකාලික ලැයිස්තුව දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීම | - | ඔක්තෝබර් 15 |
| (v) | අභියාචනා හා විරෝධතා භාර ගැනීමේ අවසාන දිනය | - | ඔක්තෝබර් 31 |
| (vi) | අභියාචනා හා විරෝධතා පරීක්ෂණය | - | නොවැම්බර් 16 – දෙසැම්බර් 13 |
| (vii) | අවසාන ලේඛනය ප්‍රසිද්ධ කිරීම | - | දෙසැම්බර් 20 |
| (viii) | පළමු වන ශ්‍රේණියේ පන්ති ආරම්භ කිරීම | - | පළමු වන පාසල් වාරය ආරම්භ වන පළමු වන දිනය |

17.1 තෝරාගත් ළමයින් සී 32 ලේඛනයට ඇතුළත් කර පළමුවන ශ්‍රේණියේ පන්තිවල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය විධිමත් ලෙස ආරම්භ කිරීමට පෙර තෝරා ගත් ළමයින් හඳුනා ගැනීම සඳහා කණ්ඩායම් වශයෙන් පාසල්වලට ගෙන්වා ගත යුතු ය.

## 18.0 පොදු කරුණු

18.1 ළමයින් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ඇති වන ගැටලු පිළිබඳ ව අයදුම්කරුවන් විසින් විමසීම් සිදු කරන අවස්ථාවල දී, එම ගැටලුවලට පිළිතුරු ලබා දීම සඳහා නිශ්චිත දිනයන් හා වේලාවන් වෙන් කර, විද්‍යාලයේ මෙම ගැටලුවලට පිළිතුරු සැපයිය හැකි නියෝජ්‍ය විදුහල්පතිවරයකු හෝ සහකාර විදුහල්පතිවරයකු නම් කළ යුතු අතර, ලකුණු ලබා දීම, ප්‍රතික්ෂේප කිරීම ඇතුළු කරුණුවලට හේතු, ඔවුන් විසින් පැහැදිලි ව අයදුම්කරුවන් දැනුවත් කළ යුතු ය.

18.2 ළමයින් ඇතුළත් කිරීමේ කටයුතුවල නිරත වන අවස්ථාවන්හි දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ හෝ අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් විසින් හිතාමතා වැරදිකර ඇත්නම් ඒ පිළිබඳ ව සම්පූර්ණ වගකීම අදාළ සාමාජිකයන් විසින් දැරිය යුතු බව අවධාරණය කරමි.

18.3 පාසලින් මව්පියන් වෙත යොමු කරනු ලබන ලිපි සම්බන්ධයෙන් විමසීම් කරන විට දී එයට අදාළ තොරතුරු ලබා දීම සඳහා එසේ යොමු කරනු ලබන ලිපි පිළිබඳ සවිස්තර වාර්තාවක් පාසල තුළ රඳවා තබා ගැනීමට කටයුතු කළ යුතු ය.

18.4 ස්වාභාවික ව්‍යසන හේතු කොට ගෙන හෝ පිළිගත හැකි වෙනත් ව්‍යසනයක් හේතුවෙන් අවතැන් වූ පවුල්වල ළමයින් පාසල්වලට ඇතුළත් කිරීමේ දී උප්පැන්න සහතික ආදිය නොමැති වූ විට, එකී පවුල් ස්වාභාවික ව්‍යසනයකට පත් වූ බවට පිළිගත හැකි ග්‍රාම නිලධාරි සහතිකය/අනාථ කඳවුරු සහතිකය ආදිය සලකා බලා සුදුසු පරිදි ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතු ය. එහෙත් උපන්දිනය සනාථ කිරීම සඳහා උප්පැන්න, විවාහ හා මරණ පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හෝ ඔහු/ඇය විසින් බලය පවරන ලද අදාළ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා හෝ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයකු විසින් නිකුත් කරනු ලබන අනුමාන වයස් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

18.5 විධිමත් පරිදි පාසල්වලට ඇතුළත් නොවූ, පාසල් යා යුතු වයසේ ළමයින් හා නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන යටතේ සාක්ෂරතා පන්තිවලට සහභාගී වී සාක්ෂරතා කුසලතා ලැබූ ළමයින්, ඔවුන්ගේ වයස හා ප්‍රවීණතාව සලකා සුදුසු පන්තිවලට ඇතුළත් කර ගැනීමට හැකි ය. සාක්ෂරතා පන්තිවලට හෝ වෙනත් පාසලකට නොගිය ද විදුහල්පති ඇතුළු මණ්ඩලයක් මඟින් ළමයාගේ දක්ෂතා පරීක්ෂා කර බලා පුරප්පාඩු අනුව, ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය. ළමයින් සඳහා උප්පැන්න සහතිකය නොමැති නම් ඒ වෙනුවට උපන් දිනය සනාථ කිරීමට උප්පැන්න විවාහ හා මරණ පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හෝ ඔහු/ඇය විසින් බලය පවරන ලද අදාළ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා හෝ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයකු විසින් නිකුත් කරනු ලබන අනුමාන වයස් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

18.6 විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගෙන් අන්තර්කරණය යටතේ අධ්‍යාපනය ලැබීමට සුදුසු බවට අදාල කලාප අධ්‍යාපන කාර්යාල මඟින් තහවුරු කර ඇති දරුවන් පාසල්වල පළමු ශ්‍රේණියට ඇතුළත්කිරීමට චක්‍රලේඛානුකූලව අවශ්‍ය සුදුසුකම් සපුරාලන්නේ නම් එම දරුවන්ද පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු අතර, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමයින්ට ලබා දෙන සහනය මෙම අමාත්‍යාංශය මඟින් ඒ පිළිබඳ ව නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධානවලට අනුව සිදු කළ යුතු ය.

. 18.7 මෙම චක්‍රලේඛයේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 19.0 ළමයින් ඇතුළත් කිරීම සඳහා මුදල් සහ වෙනත් ආධාර ලබා ගැනීම තහනම් කිරීම.

සියලු ම රජයේ පාසල්වලට ළමයින් ඇතුළත් කිරීම වෙනුවෙන් සෘජුව ම හෝ වක්‍ර ව ආධාර මුදල් හෝ වෙනයම් බඩු බාහිරාදියක් හෝ අය කිරීම/ලබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් වේ. ළමයින් ඇතුළත් කිරීමට පෙර හෝ පසුව හෝ එවැනි බලපෑමක් නොකළ යුතු වේ. මෙලෙස බලපෑම් කිරීම සම්පූර්ණයෙන් ම නීති විරෝධී වන අතර, එවැනි අවස්ථාවල ඒ සම්බන්ධ ව දැඩි ලෙස ක්‍රියා කිරීමට සිදු වනු ඇත. පාසල් ප්‍රධානීන් හෝ පාසලට සම්බන්ධ වෙනත් කවර සංවිධානයක් හෝ තුන්වන පාර්ශ්වයක් හෝ එලෙස බලපෑම් නොකළ යුතු ය. මෙහි දී සංවිධාන යන්නෙන් ආදි ශිෂ්‍ය සංගමය, පාසල් සංවර්ධන සමිතිය ඇතුළු පාසලට සම්බන්ධ වූ සියලු ම සමිති හා සංගම් අදහස් කෙරේ. පහසුකම් හා සේවා ගාස්තු, පාසල් සංවර්ධන සමිතියේ සාමාජික මුදල හා සියලු ම ළමයින්ගෙන් අය කර ගැනීමට පාසල විසින් අනුමත කර ගෙන ඇති මුදල අය කර ගත හැකි ය.

පාසල්වලට ළමයින් ඇතුළත් කර ගැනීමේ ජාතික ප්‍රතිපත්තිය සකස්කිරීමේ බලතල මධ්‍යම රජය සතු වේ. ඒ අනුව පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන මෙම චක්‍රලේඛය, සියලු ම ජාතික හා පළාත් පාසල් සඳහා අදාළ වේ.

මෙම චක්‍රලේඛයෙන් පැන නගින ඕනෑ ම ගැටලුවක් සම්බන්ධයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. එමෙන් ම යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ සිදුවිය හැකි වෙනස්වීම්වලට මෙම චක්‍රලේඛයේ විධිවිධාන යටත් වේ.

ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

**පිටපත් :-**

1. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්
2. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම්
3. මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්
4. විගණකාධිපති
5. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
6. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
7. විභාග කොමසාරිස් ජනරාල්
8. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
9. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ(ජාතික පාසල්),
10. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ නීති නිලධාරී

**උපලේඛන අංක 01**

**20...... වර්ෂයේ දී .................................................................... විද්‍යාලයේ**
**පළමුවන ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා අයදුම් පත්‍රය**

(ළමයාගේ උප්පැන්න සහතිකයේ පිටපතක් හා තමා ඉල්ලුම් කරනු ලබන ගණය යටතේ, අදාළ වන සියලු ම ලිපි ලේඛනවල පිටපත්, දිවුරුම් ප්‍රකාශයක් මඟින් සහතික කර මෙයට අමුණා එවිය යුතු ය.)

**01. ඉල්ලුම් කරන ගණය :-** ........................................................................................
(ගණ කිහිපයකට අයත් නම් වෙන වෙන ම ඉල්ලුම් කළ යුතු ය.)

**02. ළමයා පිළිබඳ විස්තර :-**

2.1 සම්පූර්ණ නම:- ........................................................................................
(වාසගමට යටින් ඉරක් අඳින්න.)
2.2 මුලකුරු සමඟ නම (සිංහලෙන්) :- ........................................................................
(අගට යෙදෙන එක් නමක් පමණක් ලියන්න. උදා -බී.එස්.එස්. පීරිස් )
2.3 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) :- ......................................................................
(අගට යෙදෙන එක් නමක් පමණක් ලියන්න. උදා - B.S.S. PEIRIS)
2.4 ස්ත්‍රී/ පුරුෂ භාවය:- ................................................................................
2.5 ආගම:- ........................................................................................
2.6 ඉගෙනුම් මාධ්‍යය (සිංහල/ දෙමළ) ......................................................................
2.7 උපන්දිනය:- අවුරුද්ද............. මාසය ................ දිනය ......................
2.8 2026 ජනවාරි මස 31 දිනට වයස **:** - අවුරුදු .................. මාස ................ දින.........

**03. අයදුම්කරු පිළිබඳ විස්තර :- (මව/පියා/නිත්‍යානුකූල භාරකරු)**

| අයදුම්කරු | කලත්‍රයා |
|---|---|
| 3.1 සම්පූර්ණ නම:-............................... ........................................................ | 3.2 සම්පූර්ණ නම:-................................................. ................................................................... |
| 3.3 මුලකුරු සමඟ නම:-.......................... .......................................................... | 3.4 මුලකුරු සමඟ නම:-....................................... ..................................................................... |
| 3.5 ජාතික හැඳුනුම්පත් අංකය:- ......................................................... | 3.6 ජාතික හැඳුනුම්පත් අංකය:- .................................................................... |
| 3.7 ශ්‍රී ලාංකිකයෙක් ද:-........................... | 3.8 ශ්‍රී ලාංකිකයෙක් ද:-.......................................... |
| 3.9 ආගම:-............................................. | 3.10 ආගම:-........................................................ |
| 3.11 ස්ථිර ලිපිනය:-............................... ....................................................... | 3.12 ස්ථිර ලිපිනය:-................................................ ................................................................... |
| 3.13 දුරකථන අංකය :- ......................................................... | 3.14 දුරකථන අංකය :- ................................................................... |
| 3.15 පදිංචි ව සිටින දිස්ත්‍රික්කය:- ...................................................... | 3.16 පදිංචි ව සිටින දිස්ත්‍රික්කය:- ................................................................... |
| 3.17 පදිංචි ස්ථානය අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- ...................................................... | 3.18 පදිංචි ස්ථානය අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- ................................................................... |
| 3.19 පදිංචි ස්ථානයට අදාළ ග්‍රාම නිලධාරී වසම :-......................................... අංකය :- ..................................... | 3.20 පදිංචි ස්ථානයට අදාළ ග්‍රාම නිලධාරී වසම :-....................................... අංකය :- .................................... |

**04.** **ඉල්ලුම් කරන පාසල් (මෙම පාසල ද ඇතුළු ව තම කැමැත්ත අනුපිළිවෙළට ලිවිය යුතු ය.) :-**

| අනු අංකය | පාසලේ නම | පාසල් වර්ගය (ජාතික/ පළාත්) | පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර (මීටර්/කි.මී.) |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |
| 04. | | | |
| 05. | | | |
| 06. | | | |

(ඔබගේ ළමයා ඉල්ලුම් කරන ලද පාසල් කිහිපයකට තේරුණු අවස්ථාවක දී ඔබ විසින් ඉහත සඳහන් කරන ලද ප්‍රමුඛතා අනුපිළිවෙළ සළකා බලා ප්‍රමුඛතාව වැඩි පාසල ලබා දෙනු ලබන අතර අනෙකුත් පාසල් ලැයිස්තුවලින් නම ඉවත් කරනු ලැබේ.)

05. **ඉල්ලුම් කරන මෙම පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න දරුවාට ඇතුළත් වීමට හැකි වෙනත් පාසල්**

1. ………………………………………………………………………………………….
2. ………………………………………………………………………………………….
3. …………………………………………………………………………………………
4. …………………………………………………………………………………………
5. …………………………………………………………………………………………
6. …………………………………………………………………………………………
7. …………………………………………………………………………………………
8. ……………………………………………………………………………………....
9. …………………………………………………………………………………………
10. …………………………………………………………………………………………

**06.** **ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචිය**

(පදිංචිය සනාථ කිරීමට අවශ්‍ය ආසන්න හා සහෝදර ගණවලට අදාළ ව මව්පියන්/නිත්‍යානුකූල භාරකරු විසින් ග්‍රාම නිලධාරී කාර්යාලයෙන් විස්තර ලබා ගෙන මෙම කොටස සම්පූර්ණ කර තමන් විසින් ම සහතික කළ යුතු ය.)

වර්ෂය :

ඡන්ද ප්‍රදේශය :

ග්‍රාම නිලධාරී වසම හා අංකය :

ඡන්ද කොට්ඨාසය :

ගම/ වීදිය, වත්ත :

| ගෘහ අංකය | පිළිවෙල අංකය | ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා) |
|---|---|---|
| | | |

වර්ෂය :

ඡන්ද ප්‍රදේශය :

ග්‍රාම නිලධාරී වසම හා අංකය :

ඡන්ද කොට්ඨාසය :

ගම/ වීදිය, වත්ත :

| ගෘහ අංකය | පිළිවෙල අංකය | ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා) |
|---|---|---|
| | | |

වර්ෂය :

ඡන්ද ප්‍රදේශය :

ග්‍රාම නිලධාරි වසම හා අංකය :

ඡන්ද කොට්ඨාසය :

ගම/ වීදිය, වත්ත :

| ගෘහ අංකය | පිළිවෙල අංකය | ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා) |
|---|---|---|
| | | |

වර්ෂය :

ඡන්ද ප්‍රදේශය :

ග්‍රාම නිලධාරි වසම හා අංකය :

ඡන්ද කොට්ඨාසය :

ගම/ වීදිය, වත්ත :

| ගෘහ අංකය | පිළිවෙල අංකය | ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා) |
|---|---|---|
| | | |

වර්ෂය :

ඡන්ද ප්‍රදේශය :

ග්‍රාම නිලධාරි වසම හා අංකය :

ඡන්ද කොට්ඨාසය :

ගම/ වීදිය, වත්ත :

| ගෘහ අංකය | පිළිවෙල අංකය | ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා) |
|---|---|---|
| | | |

ඉහත තොරතුරු ඡන්ද හිමි නාමලේඛන පරික්ෂා කර මවිසින් නිවැරදි ව සටහන් කර ගත් බව මෙයින් සහතික කරමි.

....................................................... ......................................

ඉල්លුම්කරුගේ අත්සන දිනය

07. පහත සඳහන් කොටස්වල තමා ඉල්ලුම් කරන ගණයට අදාළ  කොටස් පමණක් සම්පූර්ණ කරන්න.

<table>
<tr><th>කරුණු</th><th>ලකුණු (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)</th></tr>
<tr><td>

**7.1 පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ළමයින්**

7.1.1 පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනය :<br>
..........................................................................................................<br>
..........................................................................................................<br>
..........................................................................................................<br>
..........................................................................................................

7.1.2 පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛන :<br>
..........................................................................................................<br>
..........................................................................................................<br>
..........................................................................................................<br>
..........................................................................................................

7.1.3 ඡන්දහිමි නාම ලේඛනයේ ඉල්ලුම්කරුගේ නම ඇතුළත් ව තිබෙන වසර ගණන : ......................

ඡන්ද හිමි නාම ලේඛනයේ කලත්‍රයාගේ නම ඇතුළත් ව තිබෙන වසර ගණන : ....................

ඡන්දහිමි නාම ලේඛනයේ නිත්‍යානුකූල භාරකරුගේ නම ඇතුළත් ව තිබෙන වසර ගණන : ............................................

(අයදුම්පත් ඉදිරිපත් කරන වර්ෂයට පෙර වර්ෂයේ සිට ආසන්න වර්ෂ 05ක කාලයක් සඳහා මෙය අදාළ වේ.)

අනිවාර්යයෙන් ම අංක 06 සම්පූර්ණ කළ යුතු ය.

7.1.4 ඉල්ලුම් කරන මෙම පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න ළමයාට ඇතුළත් වීමට හැකි වෙනත් පාසල් සංඛ්‍යාව : ..................

</td><td></td></tr>
<tr><td>

**7.2 ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ ළමයින්**

7.2.1 ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක වශයෙන් අයදුම්කරන ලද පාසලේ ඉගෙනුම ලැබූ ශ්‍රේණි සංඛ්‍යාව : .........................<br>
................ශ්‍රේණිය සිට .............................. ශ්‍රේණිය දක්වා

7.2.2 අයදුම්කරන ලද පාසලේ ඉගෙනුම ලැබූ කාලය තුළ ලබා ගත් අධ්‍යාපන ජයග්‍රහණ :<br>
..........................................................................................................<br>
..........................................................................................................<br>
..........................................................................................................

7.2.3 අයදුම්කරන ලද පාසලේ ඉගෙනුම ලැබූ කාලය තුළ විෂය සමගාමී කටයුතුවලින් ලබා ගත් ජයග්‍රහණ :<br>
..........................................................................................................<br>
..........................................................................................................<br>
..........................................................................................................

</td><td></td></tr>
</table>

7.2.4 ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වය, පාසල් කාලයෙන් පසු ලබා ඇති අධ්‍යාපනික ජයග්‍රහණ හා (විදුහල්පති විසින් නිර්දේශ කරන ලද) පාසලේ දියුණුව සඳහා ලබා දුන් විවිධ ආකාරයේ සහයෝග :
......................................................................................................
......................................................................................................
......................................................................................................

**7.3 දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහෝදර/ සහෝදරියන්**

7.3.1 අයදුම්කරුගේ ළමයෙකු හෝ ළමයින් පාසලේ ඉගෙනුම ලබමින් සිටී නම්

| ළමයාගේ නම | ශ්‍රේණිය හා ඇතුළත්වීමේ අංකය | මෙම පාසලට ඇතුළත් වූ ශ්‍රේණිය | ගත කළ ශ්‍රේණි ගණන |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

7.3.2 පාසලේ සිටින සහෝදර/සහෝදරියන් පාසලට ලබා දී ඇති ජයග්‍රහණ හා පාසලේ දියුණුව සඳහා ඉල්ලුම්කරු ලබා දුන් විවිධාකාරයේ සහයෝග :
......................................................................................................

7.3.3 පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනය :
..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................

7.3.4 ඡන්ද හිමි නාම ලේඛනයේ ඉල්ලුම්කරුගේ නම ඇතුළත්ව තිබෙන වසර ගණන : ....................

ඡන්ද හිමි නාම ලේඛනයේ කලත්‍රයාගේ නම ඇතුළත් ව තිබෙන වසර ගණන : ................

ඡන්ද හිමි නාම ලේඛනයේ නීත්‍යානුකූල භාරකරුගේ නම ඇතුළත් ව තිබෙන වසර ගණන : ................

(අයදුම්පත් ඉදිරිපත් කරන වර්ෂයට පෙර වර්ෂයේ සිට ආසන්න වර්ෂ 05ක කාලයක් සඳහා මෙය අදාළ වේ.)
අනිවාර්යයෙන් ම අංක 06 සම්පූර්ණ කළ යුතු ය.

7.3.5 ඉල්ලුම් කරනු ලබන මෙම පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න ළමයාට ඇතුළත් වීමට හැකි වෙනත් පාසල් සංඛ්‍යාව : ..............

| | |
|---|---|
| **7.4** අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපන අංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට ඍජුව ම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ දරුවන්<br><br>7.4.1 අදාළ ආයතනවල ස්ථිර සේවකයෙකු ලෙස තනතුර හා සේවා කාලය :<br>..........................................................................................................<br>7.4.2 දැනට දුෂ්කර පාසලක සේවයේ යෙදේ නම් අඛණ්ඩ දුෂ්කර පාසල් සේවා කාලය:<br>..........................................................................................<br>7.4.3<br>(I) දුෂ්කර පාසලක සේවයේ යෙදී ඇත්නම් එම සේවා කාලය: ...........<br>(දුෂ්කර පාසලක සේවයේ යෙදුන/යෙදෙන කාලසීමාව තුල යම් පහසු පාසලකට අනුයුක්තයක් ලබා ඇත්නම්, එම අනුයුක්ත කාලසීමාව දුෂ්කර සේවා කාලය ගණනය කිරීමේදී සලකා බලනු නොලැබේ).<br><br>(II)<br>- මුල් පත්වීම ලද සේවා ස්ථානයේ:<br>නම ........................ ලිපිනය ...................... සේවා කාලය ...................<br><br>- මුල් පත්වීම ලද සේවා ස්ථානයේ සිට ස්ථිර පදිංචි ස්ථානයට තිබු දුර (කි.මී) : ....................................<br>(මෙහිදී මුල් පත්වීම ලැබු සේවා ස්ථානයේ සේවයේ යෙදුන කාලසීමාව තුල ස්ථිර පදිංචි ස්ථානයේ සිට කි.මී.75 හෝ ඊට අඩු දුරකට අනුයුක්තයක් ලබා ඇත්නම්, එම අනුයුක්ත කාලසීමාවන් සලකා බලනු නොලැබේ.)<br><br>- මුල් පත්වීම ලැබූ අවස්ථාව වන විට ස්ථිර පදිංචි ස්ථානයේ ලිපිනය<br>..................................................................................<br>7.4.4 ලබා නොගත් නිවාඩු දින ගණන :<br>20... .....................................<br>20... .....................................<br>20... .....................................<br>20... .....................................<br>20... .....................................<br><br>7.4.5 පාසල් අධ්‍යාපනයට ඍජුවම බලපාන ආයතනයක සේවය කිරීම<br>I. ඉල්ලුම් කරන පාසලේ ම ස්ථිර සේවයේ යෙදෙන්නේ නම්, එම පාසලේ සේවා කාලය .............................................<br>II. පාසල අයත් අධ්‍යාපන කලාපය තුළ පාසලක, පාසල අයත් කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන කාර්යාලයේ කාර්යමණ්ඩලයේ ස්ථිර සේවයේ නියුතු නිලධාරියකු නම් සේවා කාලය ...................<br>III. පාසල අයත් පළාත තුළ පාසලක, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ/අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපන අංශයේ කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවයේ නියුතු නිලධාරියකු නම් සේවා කාලය ...............................<br>IV. මෙම ගණය යටතේ සලකා බලනු ලබන රජයේ පාසල් අධ්‍යාපනයට ඍජුව බලපාන අනෙකුත් ආයතනයක ස්ථිර සේවයේ නියුතු නිලධාරියකු නම්, සේවා කාලය .............................................<br><br>7.4.6 ස්ථිර පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරනු ලබන පාසලට ඇති දුර (කි.මී) :<br>..................................................................<br>7.4.7 පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනය :<br>..........................................................................................................<br>7.4.8 වර්තමාන සේවා ස්ථානයේ සිට ඉල්ලුම් කරන පාසලට ඇති දුර (කි.මී) .................... | |

| | |
|---|---|
| **7.5 රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම්/ රජයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබ පැමිණි නිලධරයන්ගේ ළමයින් :**<br>7.5.1 අවසානයට ස්ථාන මාරුවීම් ලැබ නව සේවා ස්ථානයේ වැඩ භාරගත් දිනය: ............................<br>7.5.2 ස්ථාන මාරුවීමට අදාළ ව, නව සේවා ස්ථානයේ නම හා ලිපිනය : ...................................................................................................... ......................................................................................................<br>7.5.3 ස්ථාන මාරුවීමෙන් පසු නව පදිංචි ස්ථානයේ ලිපිනය : ...................................................................................................... ......................................................................................................<br>7.5.4 ස්ථාන මාරුවීමට අදාළ ව, පෙර සේවා ස්ථානයේ නම හා ලිපිනය : ...................................................................................................... ......................................................................................................<br>7.5.5 ස්ථාන මාරුවීමට පෙර පදිංචි ස්ථානයේ ලිපිනය: ...................................................................................................... ......................................................................................................<br>7.5.6 පෙර සේවා ස්ථානයේ අඛණ්ඩ සේවා කාලය : ........................................ සිට .................................... දක්වා<br>7.5.7 පෙර සේවා ස්ථානය හා මාරුවීම් ලැබ පැමිණි නව සේවා ස්ථානය අතර දුර (කි.මී): .............................<br>7.5.8 කලත්‍රයා සේවයේ යෙදෙන්නේ නම්, ආසන්න වසර 05ක් තුළ ඔහුගේ/ඇයගේ සේවා ස්ථානයන් පිළිබඳ විස්තර:<br>සේවා ස්ථානයේ නම — ලිපිනය<br>20... .......................... ........................<br>20... .......................... ........................<br>20... .......................... ........................<br>20... .......................... ........................<br>20... . ........................ ........................<br>7.5.9 ඉල්ලුම් කරන මෙම පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න ළමයාට ඇතුළත් වීමට හැකි වෙනත් පාසල් සංඛ්‍යාව : ..........................<br>7.5.10 රාජ්‍ය/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු සේවකයෙකු ලෙස සේවා කාලය : ........................<br>7.5.11 ලබා නොගත් නිවාඩු දින ගණන :<br>20... .....................................<br>20... .....................................<br>20... ...................................<br>20... .....................................<br>20... ..................................... | |
| **7.6 ළමයා සමඟ විදේශගතව පදිංචිව සිට පැමිණෙන තැනැත්තන්ගේ දරුවන් :**<br>7.6.1 විදේශගතව සිට නැවත දිවයිනට පැමිණි දිනය : ..........................<br>7.6.2 ළමයා සමඟ අඛණ්ඩ ව විදේශගත ව සිටි කාලසීමාව : ........................... දින සිට ............................. දින දක්වා<br>7.6.3 විදේශගත වූ හේතුව :……………………………………….. ......................................................................................<br>7.6.4 ඉල්ලුම් කරන මෙම පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න ළමයාට ඇතුළත්වීමට හැකි වෙනත් පාසල් සංඛ්‍යාව: ..................................... | |

08. ප්‍රකාශය :

මගේ ළමයා ඉගෙනීම පිණිස රජයේ හෝ රජයේ අනුමත පෞද්ගලික හෝ වෙනත් පාසලකට හෝ දැනට නොයන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි. පුවත්පතේ පළවන පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම පිළිබඳ විධිවිධාන හා උපදෙස් හි අංක 01 සිට අංක 12 දක්වා දැක්වෙන කරුණුවලට එකඟ වෙමි. තව ද, මෙහි ඉහතින් සඳහන් කරනු ලැබූ තොරතුරු සත්‍ය බවත්, මවිසින් මෙහි සඳහන් කළ ස්ථිර පදිංචිය හා අනෙකුත් තොරතුරු පිළිබඳ සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කිරීමට එකඟවන බවත් ප්‍රකාශ කරමි. මවිසින් සඳහන් කරන ලද යම් තොරතුරක් අසත්‍ය/කූට බව හෙළි වුවහොත් මාගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබන බවත් මම දනිමි. මාගේ ළමයා පාසලට ඇතුළත් කළ පසු තොරතුරු අසත්‍ය/කූට බව හෙළි වුවහොත් ඔහු/ ඇය පාසලෙන් ඉවත් කර ගෙන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කෙරෙන එම ප්‍රදේශයේ වෙනත් පාසලකට ඇතුළත් කිරීමට මම එකඟ වෙමි.

............................ ......................................................................................

දිනය මවගේ/ පියාගේ/ නිත්‍යානුකූල භාරකරුගේ අත්සන

උපලේඛන අංක **02**

**අයදුම්කරු තමා විසින් ද සම්මුඛ පරීක්ෂණය සහ අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මගින් ද ලබා දුන් ලකුණු සටහන් කිරීමට අදාළ ආකෘතිය**

විදුහල: ................................................................

ලිපිනය: ..............................................................

**පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම - 20......**

**ලකුණු ලබා ගත් ආකාරය - ...................................... (ගණය)**

(මෙම ලේඛනය දෙමාපියන් විසින් සම්මුඛ පරීක්ෂණය සහ අභියාචනා අවස්ථාවන් හි දී රැගෙන ආ යුතු ය.)

ළමයාගේ නම : ............................................................

අයදුම්කරුගේ නම : ....................................................

අයදුම්කරුගේ හැඳුනුම්පත් අංකය : .................................

| විස්තරය | අයදුම්කරු විසින් සටහන් කරන ලකුණු | ප්‍රථම සම්මුඛ පරීක්ෂණය ලකුණු | අභියාචනා හා විරෝධතා පරීක්ෂණය ලකුණු | සටහන් |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| මුළු එකතුව | | | | |

පරීක්ෂණ මණ්ඩල මගින් ලබා දුන් ඉහත ලකුණුවලට එකඟ වන බවත්, වැරදි/කූට ලේඛන ලබා දී ඇති බව තහවුරු වුවහොත් ලකුණු සංශෝධනය වීමට/ අහෝසි වීමට ඉඩ ඇති බවත් මම දනිමි.

| | (ප්‍රථම සම්මුඛ පරීක්ෂණය) | (අභියාචනා හා විරෝධතා පරීක්ෂණය) |
|---|---|---|
| අයදුම්කරුගේ අත්සන | ...................... | ......................... |
| පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිගේ අත්සන | ...................... | ......................... |
| දිනය | ...................... | ......................... |

(ඉහත ලකුණට අයදුම්කරු එකඟ වීම ද, පරීක්ෂණ මණ්ඩලයේ සභාපති සහතික කිරීම ද, තහවුරු කිරීම සඳහා ප්‍රථම සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හා අභියාචනා හා විරෝධතා පරීක්ෂණයෙන් පසුව අත්සන් කර දිනය යෙදිම ද සිදුකළ යුතු ය. )

**උපලේඛන අංක 03**

**අභියාචනා/විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා උපයෝගී කර ගත යුතු ආකෘතිය**

1.0 අභියාචනා/විරෝධතා ඉදිරිපත් කරන්නා පිළිබඳ විස්තර :

1.1 අභියාචනා/විරෝධතා ඉදිරිපත් කරන්නාගේ නම : .................................
1.2 ලිපිනය :...........................................................................................
1.3 ළමයාගේ නම හා කැඳවීම් අංකය :......................................................

2.0 විරෝධතාවට ලක්වන ළමයා/ළමයින් පිළිබඳ විස්තර (විරෝධතා ඉදිරිපත් කරන්නන් පමණක් මෙය සම්පූර්ණ කළ යුතු ය.) :

2.1 විරෝධතාවට ලක්වන ළමයාගේ නම :....................................................
2.2 එම ළමයාගේ ගණය හා කැඳවීම් අංකය :..................................................
2.3 දෙමව්පියන්/භාරකරුගේ නම :................................................................
2.4 ලිපිනය :..........................................................................................

3.0 අභියාචනා/විරෝධතාවය
3.1 අභියාචනා/විරෝධතා දැක්වීමට හේතු :....................................................
3.1 එය සනාථ කිරීමට ඉදිරිපත් කරනු ලබන කරුණු :....................................

දිනය - ......................

......................................
අභියාචනා/විරෝධතා ඉදිරිපත් කරන්නාගේ අත්සන

උපලේඛන අංක **04**

**ඇතුළත් කිරීම සඳහා තෝරා ගත් බවට දන්වන ලිපියේ ආකෘතිය**

විදුහල: ....................................................................
ලිපිනය: .................................................................
දිනය : ...................................................................

...................................................................... මයා/ මිය,
......................................................................
......................................................................

**පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම - 20......**

ළමයා අයත් ගණය : ...................................................
එම ගණයට තීරණය වූ අවම ලකුණු : .............................
ළමයා ලබා ගත් ලකුණු : .........................

ඔබේ ළමයා වන ...................................................................... මෙම විද්‍යාලයේ පළමු වැනි ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා තෝරා ගෙන ඇති බව සතුටින් දන්වමි.

ඒ අනුව, ළමයා පාසලට ඇතුළත් කිරීම සඳහා පාසල විසින් දන්වා එවනු ලබන දින සිට සති 2ක් ඇතුළත ළමයා පාසලට ඇතුළත් නොකරන්නේ නම්, ඔබේ ළමයා පාසලට ඇතුළත් නොකරන සේ සළකා කටයුතු කරන බව කාරුණිකව දන්වමි.

තවද, තෝරා ගැනීම පිළිබඳ යම් කිසි අක්‍රමිකතාවක් සිදු කර ඇතැයි සනාථ වුවහොත් මේ තෝරා ගැනීම අවලංගු විය හැකි බව සැලකිය යුතු ය.

විදුහල්පතිගේ අත්සන හා
නිල මුද්‍රාව

**උපලේඛන අංක 05**

**ප්‍රතික්ෂේප වූ බව දන්වන ලිපියේ ආකෘතිය**

විදුහල: ......................................................................
ලිපිනය: ...................................................................
දිනය: ........................................................................

...................................................................... මයා/ මිය,
......................................................................
......................................................................

**පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම - 20......**

ළමයා අයත් ගණය : ....................................................
එම ගණයට තීරණය වූ අවම ලකුණු : ...............................
ළමයා ලබා ගත් ලකුණු : ..........................

ඔබේ ළමයා වන ....................................................................... මෙම ගණයට තීරණය වූ අවම ලකුණට වඩා අඩු ලකුණු ලබා ගත් නිසා, ඇතුළත් කර ගැනීමට හැකියාවක් නොමැති බව කණගාටුවෙන් දන්වමි. වෙනත් පාසලක් ලබා ගැනීම සඳහා ........................................ කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නව අයදුම්පතක් ඉදිරිපත් කරන්න.

එම ලිපිනය : ................................................................
................................................................
................................................................

විදුහල්පතිගේ අත්සන හා
නිල මුද්‍රාව